# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 67 — 1973 ජූලි 06 වැනි සිකුරාදා — 1973.07.06

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II අ) වැනි ඡේදය — පලකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු — ඇබෑර්තු ... ... | 805 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 819 |


## තනතුරු — ඇබෑර්තු

### ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි. දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට සාදා ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත්කිරීම් වල දී (දවස් පඩී ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5 ක් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5 ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන මුදලක් අරමුදලට දීමනාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥාපනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා යෙහි සිටින්නන් හැර සෙසු සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියමකොට ඇත්නම් මිස, අදාළවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

(ii) සියළුම නව ප්‍රවේශක නිලධාරීන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනටමත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවල මතුවට පනවනු ලබන නීතිරීති හා ව්‍යවස්ථාවලටත් අනුකූලව ක්‍රියා කළ යුතුය යන කොන්දේසිය පිළිගත යුතුය.

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

**විශේෂ නිවේදනයයි**

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දවල් 12 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

### II පෙළ සැලසුම්කරු තනතුරු

මෙම දෙපාර්තමේන්තුවේ II පෙළ සැලසුම්කරු තනතුරු සඳහා ලාංකිකයන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. පහත දක්වෙන ආකෘතිය අනුව පිළියෙල කළයුතු එකී අයදුම් පත් 1973 ජූලි 18 දින හෝ ඊට පෙර ලැබෙන ලෙස, කොළඹ 1, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ, ගොඩනැගිලි අධ්‍යක්ෂ, 'කල' ශාඛාව වෙත ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි.

2. **වැටුප.**—මෙම තනතුරට අයත් ඒකාබද්ධ වැටුප් ක්‍රමය නම්, වර්ෂයකට රු. 3,576—144 × 20—රු. 6,456 කි.

3. **වයස් සීමාව.**—1973 ජූලි මස 18 දිනට වයස අවුරුදු 18 කට නොඅඩු සහ 40 කට නොවැඩි විය යුතුයි.

4. **අවශ්‍ය අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම්.**—

(1) ගණිතය විෂයයක් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ ගණිතය සහ සිංහල/දෙමළ භාෂාව ඇතුලත්ව විෂයයන් හයකින්, දෙවරකට නොවැඩි වාර ගණනකදී පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයේ සාමාන්‍ය පෙළෙන් සාමාර්ථය සහ ඊට අතිරේකව පහත දක්වෙන සුදුසුකම් වලින් එකක් තිබිය යුතුයි :—

(අ) ලංකා කාර්මික විද්‍යාලයේ විවිධ ශ්‍රේණිවල ත්‍රිවාර්ෂික සන්ධ්‍යා පන්ති අනුගමනය කර තිබීම හා ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමයක් හෝ බලපත්‍ර ලත් (චාර්ටඩ්) ඉංජිනේරුවන් හෝ නිර්මාන ශිල්පීන් හෝ යටතේ අවුරුදු 4 ක් අඛණ්ඩව ආධුනිකත්වයක සේවය කර තිබීම. (මෙම සුදුසුකම් ඇති අයදුම්කරුවකු ඉහත සඳහන් වැටුප් ක්‍රමයේ වර්ෂයකට රු. 3,864 නොඉක්මවන වැටුප් පියවරක් මත පත් කිරීම සඳහා සලකා බලනු ඇත.) ;

හෝ

(ආ) ලංකා කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි කර්මාන්තය II වැනි කොටසේ විභාගයෙන් 1947 ට පෙර සමත් වී සැළසුම්කරුවකු වශයෙන් රජයේ දෙපාර්තමේන්තුවක හෝ ප්‍රසිද්ධ වෙළඳ සමාගමක හෝ දෙවර්ෂයකට වැඩි කාල සීමාවක් සේවය කර තිබීම ;

හෝ

(ඇ) ප්‍රසිද්ධ ඉංජිනේරු සමාගමක හෝ බලපත්‍ර ලත් (චාර්ටඩ්) ඉංජිනේරුවන් හෝ නිර්මාණ ශිල්පීන් හෝ යටතේ සැළසුම්කරුවකු වශයෙන් පස් වර්ෂයක් සේවය කර තිබීම.

**සැළකිය යුතුයි.**—සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අපේක්ෂකයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ ඊට සමාන විභාගයකදී සිංහල භාෂාවෙන් හෝ ඊට සමාන විෂයයකින් සමත් වී සිටිය යුතුයි.

(1961 ජනවාරි 1 වැනිදාට පෙර දිනයක සිට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින සහ රාජ්‍ය සේවයේ අනෙක් තනතුරු සඳහා පත්වීම් අපේක්ෂා කරන නිලධාරීන්ට මේ අවශ්‍යතාවය අදාල නොවේ.

5. **සේවා කොන්දේසි.**—

(i) මෙම තනතුරු ස්ථිරය. රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක වනු ලැබේ.

(ii) තෝරාගනු ලබන අයදුම්කරුවනට කායඝීල ඇතුලත මෙන්ම එලිමහනේ රාජකාරි කිරීමට නියම කරනු ඇත.

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග, මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහයේ රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ රජය මගින් කලින් කලට නිකුත් කරන වෙනත් නියෝග හෝ රෙගුලාසි වලට ඔවුන් යටත් විය යුතුයි.

(iv) රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාද, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ද දැනට සම්පාදනය කර ඇති හෝ මින් මතු සම්පාදනය කෙරෙන හෝ ව්‍යවස්ථාවන්ට අනුකූලව ක්‍රියා කරන ලෙස ඔවුන්ට නියම කරනු ඇත.

6. පහත සඳහන් ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ.) අයදුම්කරුවන් විසින් අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බව්තීස්ම සහතිකය හෝ උපකාත පාසැල් පිළිබඳව ඇති රෙගුලාසි සංග්‍රහයේ අරමුණු සඳහා නිකුත් කර ඇති සහතිකය හෝ භාරගනු නොලැබේ.)

(ආ) අධ්‍යාපනික හා කාර්මික සුදුසුකම් සනාථ කරන සහතික.

(ඇ) චරිත සහතික දෙකක්.

7. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසෙහි (IIඅ) ඡේදය ආරම්භයේ පළ කර ඇති රාජ්‍ය සේවා තනතුරු වලට පත් කිරීම සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි ද බලන්න.

ජේ. බී. වීරරත්න,
ගොඩනැගිලි අධ්‍යක්ෂ වෙනුවට.

1973 ජූනි මස 12 දින,
කොළඹ 1, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේදීය.

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

### II පෙළ සැලසුම්කරු තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය

1. (i) නම (මුලකුරු සමග) :————.

(ii) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ලියුම් ලැබෙන පිළිවෙල :————.

3. (i) උපන් දිනය හා ස්ථානය :————.
(උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි.)

(ii) 1973 ජූලි 18 දිනට වයස :—අවුරුදු :——, මාස :——.

4. (i) ජාතිය :————.

(ii) ලාංකිකවූයේ පරම්පරාවෙන් ද ? ලියාපදිංචිවීමෙන් ද ?
————.

5. විවාහකද අවිවාහකද යන බව :————.

6. අධ්‍යාපන සහ කාර්මික සුදුසුකම් :————.
(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

7. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර :————.

8. මීට කලින් ආණ්ඩුවේ යම්කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස් වීමට හේතුව සඳහන් කරන්න.————.

9. කාර්මික පුහුණුවක් ඇතොත් විස්තර :————.

10. චරිත සහතික දී ඇති පුද්ගලයන්ගේ නම් සහ පදවි නාම :
————.

මා විසින් ඉහත සපයා ඇති තොරතුරු සත්‍ය බව හා නිවැරදි බව සහතික කරමි. මෙහි අඩංගු කිසියම් තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරාගනු ලැබීමට පෙර සොයාගනු ලැබුවහොත්, මා නුසුදුස්සකු කරනු ලැබීමටත්, පත් කිරීමෙන් පසු එම ප්‍රමාද දෝෂය අසුවුවහොත්, වන්දි රහිතව සේවයෙන් පහ කරනු ලැබීමටත් මා යටත්ව සිටින බවද දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7–74—73.07.06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

## ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ වාණිජ අධිකාරී තනතුර

ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ වාණිජ අධිකාරී තනතුර සඳහා මෙයින් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. මේ සඳහා මෙම කාර්යාලයෙන් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රවල ඉල්ලුම් පත් පිළියෙල කොට ඒවා පහත සඳහන් දිනවල (හෝ ඊ) ට පෙර හෝ මා වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(අ) මෙරට ඉල්ලුම්පත් : 1973 ජූලි මස 31 වැනිදා.

(ආ) පිටරට ඉල්ලුම්පත් : 1973 අගෝස්තු මස 10 වැනිදා.

**සංලක්ෂ්‍යය.**—(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝරම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යන්න ඉතා පැහැදිලිව සටහන් කොට 9″×4″ ප්‍රමාණයට වඩා කුඩා නොවූද, තමලිපිනය ලියන ලදදාවූද, මුද්දර නොගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් හෝ තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැකිය. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි පාඩු අයදුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල ඉල්ලුම් කරුවන්ට පිටරටවල සිටින ශ්‍රී ලංකා නියෝජිතයන්ගේ කාර්යාල වලින් මුද්‍රිත ඉල්ලුම් පත් පෝරම ලබාගත හැකිය. තම ඉල්ලුම්පත් ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රවාහණ අමාත්‍යාංශයේ ලේකම් වෙත එවනු සඳහා තමන් පදිංචි රටට හෝ පත්කොට සිටින ශ්‍රී ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුලතදී භාරදීමට කැමතිනම් ඔවුන්ට එසේ කළ හැකිය.

2. **බඳවා ගැනීමේ ක්‍රමය.**—නියමිත සුදුසුකම් ඇති අපේක්ෂකයින් ඇතුළත්වීමේ පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. මෙම පරීක්ෂණය ලිඛිත හා ප්‍රායෝගික යනුවෙන් කොටස් දෙකකින් යුක්ත වේ.

(i) ලිඛිත පරීක්ෂණය.—

(අ) සිංහල භාෂාව පිළිබඳ පැය 3 ක ප්‍රශ්න පත්‍රයක් (වාක්‍ය රචනයක් ඇතුළුව),

(ආ) පහත සඳහන් විෂයයන් ආශ්‍රිතව උඩරට හෝ පහත රට හෝ සබරගමු නැටුම් පිළිබඳව පැය 3 ක ප්‍රශ්න පත්‍රයක් (අපේක්ෂකයින්ට කැමති කොටසකට පිළිතුරු සැපයීමට හැකිය) :—

(ඒ) උඩරට හෝ පහත රට හෝ සබරගමු දණ්ඩකඳේ සරඹ,

(බී) තනි තිත, දෙතිත, තුන්තිතට අයත් බෙර මාත්‍රා කන්තිරම් හා අඩව්,

(සී) වන්නම් හෝ සින්දු වන්නම්,

(ඩී) උඩරට හෝ පහත රට හෝ සබරගමු බෙර වාදනයට අයත් බෙර සරඹ.

(ii) ප්‍රායෝගික පරීක්ෂණය.—ලිඛිත පරීක්ෂණය යටතේ දක්වෙන නැටුම් ගායනය හා වාදනය පිළිබඳව ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

3. මෙම විද්‍යාලයේ ඉගෙනීම සඳහා කිසිම ගාස්තුවක් අය කරනු නොලැබේ.

4. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. අසත්‍ය කරුණු ඇති බව ඔප්පු වුවහොත් අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. විද්‍යාලයට ඇතුළත් කර ගැනීමෙන් පසුව මෙවැනි කරුණු අනාවරණය වුවහොත් විද්‍යාලයෙන් නෙරපා දැමීමට ද යටත්වනු ඇත.

ඒ. ජේ. එස්. ගුණවර්ධන,
කොළඹ ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ.

**රජයේ නාට්‍ය හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයට සිසුන් බඳවා ගැනීමේ අයදුම්පත්‍රය—1973-74 වර්ෂය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. ජාතිය :————.
(ලාංකික වන්නේ (අ) පරම්පරාවෙන් ද, (ආ) ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියකු වන්නේ ලියාපදිංචි කිරීමෙන් නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳහුම් අංකයත් සඳහන් කරන්න.)

4. (අ) උපන් දිනය :————.
(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට නියම වයස :—
අවු :————, මාස :————, දින :————.

5. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

6. අයදුම්කරුගේ පියාගේ/මවගේ/භාරකරුගේ නම :————.

7. ඔහුගේ/ඇගේ ලිපිනය :————.

8. ඔහුගේ/ඇගේ රැකියාව :————.

9. අයදුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම් :—

| විභාගයේ නම | සමත් වූ වර්ෂය | විෂයයන් |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ........................ | ........................ | ........................ |
| ........................ | ........................ | ........................ |
| ........................ | ........................ | ........................ |

10. නැටුම් පිළිබඳ ලබා ඇති සුදුසුකම් :————.

11. හැදෑරීමට බලාපොරොත්තුවන විෂයයන් :————.
(උඩරට නැටුම්, පහතරට හෝ සබරගමු නැටුම් ද යන වග සඳහන් කරන්න.)

12. චරිත සහතික බලාගත් අයගේ නම් සහ තත්ත්වය :—
(මෑතකදී ලබාගත් චරිත සහතික 2 ක පිටපත් ඇමිණිය යුතුය.)
1. ————.
2. ————.

13. අයදුම්කරු රැකියාවක යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් විස්තර සත්‍ය බව ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(රු. 5 ක මුද්දරයක් මත කෙටි අත්සන තැබිය යුතුය.)

**සැ. යු.**—වයස අවුරුදු 18 ට අඩු සෑම අපේක්ෂකයෙක් විසින් ම පහත දැක්වෙන සහතිකය තමාගේ පියා/මව/භාරකරු ලවා සහතික කර ඉල්ලුම්පත්‍රයට ඇමිණිය යුතුය.

ඉහත සඳහන් ................................ ගේ පියා/මව/භාරකරු වන මම අයදුම්කරු විසින් ඉල්ලුම්පතෙහි සඳහන් කර ඇති සියළු විස්තර සත්‍ය බවට සහතික කරමි. ඔහු/ඇය රජයේ නාට්‍ය හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයට ඇතුළත්වී ඉගෙනීම ගැන මගේ කිසිදු විරුද්ධත්වයක් නොමැත.

————,
අත්සන : මව/පියා/භාරකරු.

නම :————.

ලිපිනය :————.

දිනය :————.

7-81/1—73. 07. 06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

**රජයේ සංගීත විද්‍යාලයට සිසුන් බඳවා ගැනීම—1973-74 වර්ෂය**

රජයේ සංගීත විද්‍යාලයේ 1973-74 අධ්‍යාපන වර්ෂයෙන් ආරම්භ වන පස් අවුරුදු පාඨමාලාව හැදෑරීම සඳහා පහත දක්වෙන සුදුසුකම් ඇති අවිවාහක අයදුම්කරුවන්ගෙන් (ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන් ම) අයදුම්පත් භාරගනු ලැබේ. මෙහි පහතින් පෙනෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1973 ජූලි මස 31 වැනි දිනට හෝ ඊට පෙර කොළඹ 7, ඇල්බට් චන්ද්‍රවංකයේ අංක 27 හි පිහිටි රජයේ සංගීත විද්‍යාලයේ විදුහල්පති වෙත ලේඛණගත තැපැලෙන් එවිය යුතුය.

1. **සුදුසුකම්.**—(අ) 1973 ජූලි 31 දිනට වයස අවුරුදු 16 ට නො අඩු විය යුතු අතර, අවුරුදු 25 ට නොවැඩි විය යුතුයි.

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ වාර දෙකකට නොවැඩි ගණනකදී සිංහල භාෂාව, අංක ගණිතය හෝ ගණිතය ඇතුළුව විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී සිටිය යුතුය.

(ඉ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සංගීත විෂයයෙන් හෝ විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන පෙරදිග සංගීත (ගාන්ධර්ව) විභාගයෙන් යටත් පිරිසෙයින් ප්‍රාරම්භ කොටසින් හෝ සමත් විය යුතුය.

**සටහන.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ හෝ වෙනත් පිළිගත් විභාගයකදී සිංහල සාහිත්‍ය, ඉතිහාසය සහ සංස්කෘත භාෂාව යන විෂයයන් ගෙන් සාමාර්ථය ලබා ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

2. නියමිත සුදුසුකම් ඇති අපේක්ෂකයින් ඇතුළත්වීමේ පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. මෙම පරීක්ෂණය ලිඛිත හා ප්‍රායෝගික යනුවෙන් කොටස් දෙකකින් යුක්ත වේ.

(i) **ලිඛිත පරීක්ෂණය.**—(අ) වාක්‍ය රචනයක් ඇතුළුව සිංහල භාෂාව පිළිබඳ පැය 3 ක ප්‍රශ්න පත්‍රයක්,

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සංගීතය පිළිබඳ නිර්දේශ පත්‍රයේ තත්ත්වයේ පැය 3 ක සංගීත පිළිබඳ ප්‍රශ්න පත්‍රයක්.

(ii) **ප්‍රායෝගික පරීක්ෂණය.**—අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ සංගීත විභාග මට්ටමේ ප්‍රායෝගික පරීක්ෂණයක් පවත්වනු ලැබේ. මෙම පරීක්ෂණය ගායනය, ස්වර වාද්‍ය හා තාල වාද්‍ය යන කොටස් 3 කින් යුක්තය. අයදුම්කරුවන් මෙයින් එක කොටසක පරීක්ෂණයට ඉදිරිපත් විය යුතුය. තාල වාදනය සඳහා අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙ.) විභාගයේ නිර්දේශයේ දක්වෙන තාල නියමිත ය.'

3. මෙම විද්‍යාලයේ ඉගෙනුම සඳහා ගාස්තුවක් අය කරනු නොලැබේ.

4. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. අසත්‍ය කරුණු ඇතුළත් කර ඇති බව ඔප්පු වුව හොත්, ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරන බවත්, විද්‍යාලයට ඇතුළත් කරගත් පසුව වුවද, නෙරපා හරිනු ලබන බවත් සැලකිය යුතු ය.

ඒ. ජේ. එස්. ගුණවර්ධන,
කොළඹ ප්‍රදේශයේ අධ්‍යාපන අධ්‍යක්ෂ.

1973 ජූනි මස 19 වන දින,
කොළඹ 7 ග්‍රීන්පාත් හි,
ප්‍රාදේශීය අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ දී.

ආකෘති පත්‍රය

**රජයේ සංගීත විද්‍යාලයට සිසුන් බඳවා ගැනීමේ අයදුම් පත්‍රය 1973-74 අධ්‍යයන වර්ෂය**

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.

2. ලිපිනය :————.

3. ජාතිය :————.
(ලාංකික වන්නේ (අ) පරම්පරාවෙන් ද (ආ) ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියකු වන්නේ ලියාපදිංචි කිරීමෙන් නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදහුම් අංකයත් සඳහන් කරන්න.)

(4) (අ) උපන් දිනය :————.
(ආ) අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට නියම වයස :—
අවුරුදු :————, මාස :————, දින :————.

5. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

6. අයදුම්කරුගේ පියාගේ/මවගේ/භාරකරුගේ නම :————.

7. ඔහුගේ/ඇගේ ලිපිනය :————.

8. ඔහුගේ/ඇගේ රක්ෂාව :————.

9. අයදුම්කරුගේ අධ්‍යාපන සුදුසුකම් :—.

| විභාගයේ නම | සමත් වූ වර්ෂය | විෂයයන් |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ........................ | ........................ | ........................ |
| ........................ | ........................ | ........................ |
| ........................ | ........................ | ........................ |

10. සංගීතය පිළිබඳ ලබා ඇති සුදුසුකම් :————.

11. හැදෑරීමට බලාපොරොත්තු වන විෂයයන් :————.
(ගායනය/ස්වර වාද්‍ය/තාල වාද්‍ය)

12. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ තත්ත්ව :—.
(මෑතකදී ලබාගත් චරිත සහතික 2 ක පිටපත් ඇමිණිය යුතු ය)
(i) :————.
(ii) :————.

13. අයදුම්කරු රැකියාවක යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් විස්තර සත්‍ය බව ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(රු. 5 ක මුද්දරයක් මත කෙටි අත්සන තැබිය යුතුය.)

**සැලකිය යුතුයි.**—වයස අවුරුදු 18 ට අඩු සෑම අපේක්ෂකයකු විසින්ම පහත දැක්වෙන සහතිකය තමාගේ පියා/මව/භාරකරු ලවා සහතික කර ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතු ය.

ඉහත සඳහන් ............................ ගේ පියා/මව/භාරකරු වන මම අයදුම්කරු විසින් ඉල්ලුම් පතෙහි සඳහන් කර ඇති සියලු විස්තර සත්‍ය බවට සහතික කරමි. ඔහු/ඇය රජයේ සංගීත විද්‍යාලයට ඇතුල්වී ඉගෙනීම ගැන මගේ කිසිදු විරුද්ධත්වයක් නොමැත.

————,
**අත්සන : (පියා/මව/භාරකරු.)**

නම :————,
ලිපිනය :————,
දිනය :————.

7-81/2—73. 07. 06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

**ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය**

පුරප්පාඩු

වලවේ යෝජනා ක්‍රමයෙහි පහත දැක්වෙන තනතුරු සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

1. **කෘෂිකාර්මික නිලධාරීන්.**—

අයදුම්කරුවන් අවුරුදු 22 ටත් 40 ටත් අතර අය විය යුතුය. පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි.

(අ) **පිළිගත් විශ්ව විද්‍යාලයකින් කෘෂිකර්මය පිළිබඳ ලත් උපාධියක්.**

**හෝ**

(ආ) කෘෂිකාර්මික පාසැලකින් **කෘෂිකර්මය පිළිබඳ ලබාගත් ඩිප්ලෝමා සහතිකය සහ අවුරුදු 8 ක පළපුරුද්ද.**

අවුරුද්දකට රු. 8,520—6×240—රු. 9,960 දරණ වැටුප් **පරිමාව** මත මණ්ඩලයේ සේවයේ පස්වෙනි ශ්‍රේණියට පත්වීම් කරනු ලැබේ.

2. **මගා නිලධාරීන්.**—

අයදුම්කරුවන් අවුරුදු 22 ටත් 30 ටත් අතර අය විය යුතුය. අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනක විෂයයන් 6 කින් සමත්වී සිටිය යුතු අතර, කෘෂිකාර්මික පාසැලකින් ලත් ඩිප්ලෝමා සහතිකයක් ඔවුන් සතුව තිබිය යුතුයි.

මණ්ඩලයේ සේවයෙහි අවුරුද්දකට රු. 4,296—12×144—6,024 දරණ වැටුප් පරිමාව මත 7 වැනි ශ්‍රේණියට පත්වීම් දෙනු ලැබේ.

3. **කෘෂිකර්ම ව්‍යාප්ති කම්කරුවන්.**—

අයදුම්කරුවන් අවුරුදු 20 ටත් 30 ටත් අතර විය යුතුය. එමාවුන් අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනක විෂයයන් 6 කින් සමත්වී සිටිය යුතු අතර, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රයෝගික ගොවිකම් පාසැලකින් ලත් සහතිකයක් ඔවුන් සතුව තිබිය යුතුයි. මණ්ඩලයේ සේවයෙහි රු. 2,760—8—60—3,240 දරණ වැටුප් පරිමාව මත **9 වැනි ශ්‍රේණියට පත්වීම්** දෙනු ලැබේ.

**මෙම කාර්යාලයෙන් ලබාගන්නා ආකෘති පත්‍ර මත අයදුම්පත්** පිළියෙල කොට ඉදිරිපත් කළ යුතුයි. තැපැලෙන් අයදුම් පත් ආකෘති පත්‍ර ඉල්ලා සිටින විට තමාගේ නම සහ ලිපිනය ලියන ලද මුද්දර ගැසූ කවරයක් සමග ඉල්ලුම් කළ යුතුයි.

අයදුම් පත් 73. 07. 28 දින හෝ ඊට ප්‍රථම මෙම කාර්යාලයට ලැබෙන සේ මෙහි පහත අත්සන් කර ඇති අය වෙත එවිය යුතුයි.

**සභාපති.**

කොළඹ 7,
බෞද්ධාලෝක මාවතේ,
අංක 415.

7-100—73. 07. 06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඊඑස්. 1/16/2.

**ඉංජිනේරු සේවා මණ්ඩලය**

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III වන පන්තියේ නාවික ඉංජිනේරු තනතුරුවල පුරප්පාඩු

ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ III වන පන්තියේ නාවික ඉංජිනේරු තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඉංජිනේරු සේවා මණ්ඩල කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති මගින් ඉදිරිපත් කළ යුතු අයදුම් පත් 1973 ජූලි මස 25 වැනි දින හෝ **ඊට පෙර කොළඹ 1, මහලේකම් ගොඩනැගිල්ලේ, ඉංජිනේරු සේවා** මණ්ඩලයේ අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ එවිය යුතුය.

සටහන :

(i) මුද්‍රිත අයදුම්පත් ආකෘති තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියකුද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 8″ × 4″ ප්‍රමාණයට කුඩා නොවූ ද නම ලිපිනය ලියන ලද්දාවූද, මුද්දර නොගැසුවාවූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) අයදුම් පතක් හෝ ඒ හා සම්බන්ධ ලියමනක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා අයදුම් පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ අයදුම්කරුවින් විසින්ම විඳ දරා ගත යුතුවේ.

වාර්ෂික වර්ධක 10 කින් හා රු. 480 වැටුප් වර්ධක 11 කින් අවුරුද්දකට රු. 16,320 දක්වා වැඩිවේ. රු. 11,040 සහ රු. 14,400 වැටුප් ලක්‍ෂයන්ට පෙර කාර්යක්‍ෂමතා කඩඉම් සහිතයි.

සටහන :

(අ) තෝරාගනු ලබන අපේක්‍ෂකයා/අපේක්‍ෂිකාව ඉහත සඳහන් ඒකාබද්ධ වැටුප් ක්‍රමයේ රු. 11,520 දරන වාර්ෂික වැටුප ඉක්මවායෑමට පෙර සත්ත්වවිද්‍යා විෂයෙහි පී. එච්. ඩී. හෝ එම්. එස්. සී. හෝ උපාධිය ලබාගත යුතුය.

(ආ) තෝරාගනු ලැබූ අපේක්‍ෂකයා/අපේක්‍ෂිකාව පිළිගත් විශ්ව විද්‍යාලයක පී. එච්. ඩී. හෝ එම්. එස්. සී. උපාධියක් හෝ ලබා ඇත්නම්, ඉහත දැක්වෙන වැටුප් ක්‍රමයේ රු. 8,520 දරන වාර්ෂික වැටුප් පියවරේ පිහිටුවනවා ඇත.

4. සුසුදුකම්.—හැම අයදුම්කරුවකු විසින්ම තමා පහත සඳහන් සුදුසුකම් වලින් යුක්ත බවට සතුටුදායක සාක්‍ෂ්‍ය ඉදිරිපත් කළ යුතුය.

(අ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.

(ආ) 1973.07.30 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි බව.

(දැනටමත් රජයේ සේවයෙහි නියුක්තව සිටින අයට මෙම වයස් සීමාව අදාල නොවේ.)

(ඇ) පිළිගත් විශ්ව විද්‍යාලයක සත්ත්වවිද්‍යාව පිළිබඳ පළමුවැනි නැතහොත් දෙවෙනි පන්තියේ ගෞරව උපාධියක් හෝ ඊට උසස් උපාධියක් හෝ ලබා තිබීම.

සහ

(ඈ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයේ හෝ අධ්‍යයන පොදු සහතිකපත්‍ර විභාගයේ හෝ වෙනත් උසස් විභාගයක හෝ සිංහල භාෂාව නැතහොත් සිංහල සාහිත්‍යය විෂයයෙන් සාමාර්ථ්‍යය ලබා ඇති බව.

5. පහත සඳහන් ලියකියවිලිවලින් කිසිවක් හෝ සියල්ලම හෝ ඉදිරිපත් කරන ලෙස නියමකළ විටක ඒවා අපේක්‍ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය (සැ. යු. උපකෘත පාඨශාලා රෙගුලාසි සංග්‍රහයේ කාර්‍යයන් සඳහා නිකුත්කර ඇති බෞතිස්ම උප්පැන්න සහතික භාරගනු නොලැබේ.)

(ආ) උපාධි සහතිකය හෝ උසස්ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක්.—මින් එකක් අධ්‍යයන කටයුතු පිළිබඳ අධ්‍යක්‍ෂගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්‍යවරයාගෙන් විය යුතුය.

(ඈ) වෘත්තීය සහ/හෝ ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඉ) සිංහල භාෂාවෙන් සමත් උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

සංලක්‍ෂ්‍යය

(i) ඉල්ලුම්පත්‍රයට කිසිම ලියවිල්ලක් හෝ ලියවිල්ලක පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක ඒවා ඉදිරිපත් කළ නොහැකි වන අපේක්‍ෂකයන්ගේ ඉල්ලුම් පත් ගැන සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් ස්වකීය ඉල්ලුම්පත්‍ර තම දෙපාර්තමේන්තු ප්‍රධානියන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් දිනට පසුව එවන අයදුම්පත් භාරගනු නොලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියම අවස්ථාවේ ලැබ, ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් භාරගනු ලැබේ.

7. ඉල්ලුම් පත්‍ර සහ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි යැවිය යුත්තේ සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් වෙතය. ඒවා මෙම අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (IIඅ) වෙනි ඡේදයේ ආරම්භයෙහි සඳහන් වන්නාවූද රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදාලවන්නාවූද පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම්.

1973. 06. 20 වැනි දින,
සංස්කෘතික අමාත්‍යාංශය,
212, බෞද්ධාලෝක මාවත,
කොළඹ 7.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

(සැ. යු.—අඟල් 8 1/2×13 1/2 ප්‍රමාණයෙන් කඩදාසිවල සකස් කළ යුතු අතර, ඉල්ලුම්පත්‍රය බහාලන කවරයේ වම්පස මුදුන් කෙළවරේ "සත්ත්වවිද්‍යා සහකාර තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය" යන පාඨය ලියා එය ලියාපදිංචි කළ තැපෑලෙන් සංස්කෘතික අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතුය.)

### ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ සත්ත්වවිද්‍යා සහකාර තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය

1. නම (මුලකුරු සහිතව) :————. මහතා/මිය/මෙනෙවිය.
2. සම්පූර්ණ නම :————.
3. ලිපිනය :————.
4. (අ) ලාංකිකයෙක්ද යන වග :————.
(ආ) එසේ නම් පරම්පරාවෙන්ද, ලියාපදිංචිවීමෙන්ද ?
5. උපන් දිනය : අවුරුද්ද :———, මාසය :———, දිනය :———.
6. අයදුම් පත් භාරගන්න අවසාන දිනයට වයස අවුරුදු :————.
මාස :——, දින :——.
7. විවාහකද ? අවිවාහකද ? යන බව :————.
8. අධ්‍යාපන සහ ශිල්පීය සුදුසුකම් :————.

| | විභාගය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| 1. | ———— | ———— | ———— |
| 2. | ———— | ———— | ———— |
| 3. | ———— | ———— | ———— |
| 4. | ———— | ———— | ———— |

9. පාඨශාලාවෙන් අස්වූ පසු කළ රැකියා හෝ හැදෑරූ අභ්‍යාස පිළිබඳ විස්තර.

10. මීට කලින් ආණ්ඩුවේ යම්කිසි දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය සංස්ථාවක සේවය කළේ නම් එයින් අස්වීමට හේතුව සඳහන් කරන්න.

11. යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වැරදිකරුවී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න.

12. චරිත සහතික දී ඇති පුද්ගලයන් දෙදෙනාගේ නම් සහ පදවි නාම :————.

13. ඔබ මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නොවේ නම් ඔබේ ණයතුරුස්වල ප්‍රමාණය කොපමණද ?

14. මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7-58—73.07.06. දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

### කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කටුවන්නා කෝරළයේ හදිසි මරණ පරීක්‍ෂක ධූරය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කටුවන්නා කෝරළයේ හදිසි මරණ පරීක්‍ෂක ධූරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්‍ෂකයින්ට ඉල්ලුම් පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම් පත් 1973 ජූලි 27 වන දිනට හෝ ඊට පෙර, පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි :—

"දිසාපති, කච්චේරිය, කුරුණෑගල."

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්‍ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට හැඟෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්තවීම.

(ඇ) ඉල්ලුම්කරු ඉහත කී කෝරළයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VII වන ප්‍රමාණයෙන්වත් සමත්වී සිටීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන් ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින් ද මෙම තනතුර සඳහා ඉල්ලුම් පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

6. ඉල්ලුම් පත් ලැබුණු බවට දන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතු වේ.

චන්ද්‍රානන්ද ද සිල්වා,
කුරුණෑගල දිසාපති.

1973. 05. 23 දා,
කුරුණෑගල, දිසාපති කාර්යාලයේ දී ය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කටුවන්නා කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධූරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපතේ නාමය සමග පැහැදිලි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම් පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස :————.

(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේ ද? එසේ නම් එය පිළිබඳ විස්තර :————.

9. තමන් සතු දේපොළවල වටිනාකම් සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. ඉල්ලුම්කරු ණයගැතිව සිටීද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද? :————.

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7–141—73.07.06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පහළ විසිදෙකේ කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධූරය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පහළ විසිදෙකේ කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධූරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට ඉල්ලුම් පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම් පත් 1973 ජූලි 27 වන දිනට හෝ ඊට පෙර, පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි :—

"දිසාපති, කච්චේරිය, කුරුණෑගල."

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි:—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්තවීම.

(ඇ) ඉල්ලුම්කරු ඉහතකී කෝරළයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VII වන ප්‍රමාණයෙන් වත් සමත්වී සිටීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන් ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයයින් ද මෙම තනතුර සඳහා ඉල්ලුම්පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ.

6. ඉල්ලුම්පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතු වේ.

චන්ද්‍රානන්ද ද සිල්වා,
කුරුණෑගල දිසාපති.

1973. 05. 21 දා,
කුරුණෑගල දිසාපති කාර්යාලයේ දී ය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ පහළ විසිදෙකේ කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධූරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපතේ නාමය සමග පැහැදිලි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම් පත් භාර ගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස : ————.

(ආ) උපන් දිනය හා ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේ ද? එසේ නම් එය පිළිබඳ විස්තර. ————.

9. තමන් සතු දේපොළවල වටිනාකම් සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. ඉල්ලුම්කරු ණයගැතිව සිටීද? එසේ නම් ඒ පිළිබඳ විස්තර : ————.

11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරු වී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද? :————.

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7–142—73.07.06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

**කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ මාගුල්ඹතොට කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධූරය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ මාගුල්ඹතොට කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධූරය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට ඉල්ලුම් පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

පහත දක්වා ඇති ආකෘති පත්‍රයේ අන්දමට සකස් කරන ලද අයදුම් පත් 1973 ජූලි 27 වන දිනට හෝ ඊට පෙර, පහත සඳහන් ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි :—

"දිසාපති, කච්චේරිය, කුරුණෑගල."

2. මෙම තනතුර සඳහා වැටුපක් ගෙවනු නොලැබේ. එක් එක් හදිසි මරණ පරීක්ෂණයක් වෙනුවෙන් රු. 7.50 ක දීමනාවක් බැගින් ගෙවනු ලැබේ.

3. පහත සඳහන් සුදුසුකම් තිබෙන බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(අ) ඉල්ලුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 30 කට නොඅඩු හා 60 කට නොවැඩිවීම.

(ආ) විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්තවීම.

(ඇ) ඉල්ලුම්කරු ඉහත කී කෝරළයේ ස්ථිර පදිංචිකරුවකු වීම.

(ඈ) යටත් පිරිසෙයින් සිංහල හෝ ඉංග්‍රීසි VII වන ප්‍රමිතියෙන්වත් සමත්වී සිටීම.

4. අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්න සහතිකය.

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය.

(ඇ) චරිතය පිළිබඳ මෑතකදී ලබාගත් සහතික දෙකක්.

5. රජයේ සහ සංස්ථාවල සේවකයන් ද, පළාත් පාලන ආයතනවල නියෝජිතයින් ද මෙම තනතුර සඳහා ඉල්ලුම් පත් එවීමට නුසුදුස්සෝ වෙති. ඔවුන්ගේ ඉල්ලුම් පත්‍ර භාරගනු නොලැබේ.

6. ඉල්ලුම් පත් ලැබුණු බවට දැන්වීමක් කරනු නොලැබේ. අයදුම් පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතු වේ.

චන්ද්‍රානන්ද ද සිල්වා,
කුරුණෑගල දිසාපති.

1973. 05. 23 දා,
කුරුණෑගල, දිසාපති කාර්යාලයේ දී ය.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාගුල්ඔතොට කෝරළයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම (පෙළපතේ නාමය සමග පැහැදිලි අකුරින්) :————.

2. ලිපිනය :————.

3. ස්ථිර පදිංචි ස්ථානය හා එහි පදිංචි කාලය :————.

4. (අ) අයදුම් පත් භාරගන්නා අවසාන දිනට සම්පූර්ණ වයස :————.

(ආ) උපන් දිනය සහ ස්ථානය :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපන සුදුසුකම් :————.

7. දැනට කරන රක්ෂාව :————.

8. මීට පෙර රැකියාවක් කළේද? එසේ නම් එය පිළිබඳ විස්තර :————.

9. තමන් සතු දේපොළවල වටිනාකම් සහ ප්‍රමාණයන් විස්තර සහිතව :————.

10. ඉල්ලුම්කරු ණයගැතිව සිටීද? එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

11. ඉල්ලුම්කරු කිසියම් චෝදනාවකට වරදකරුවී අධිකරණයක් මගින් දඬුවම් ලබා තිබේද? :————.

12. මෙම තනතුර සඳහා වෙනත් සුදුසුකම් ඇතොත් ඒ පිළිබඳ විස්තර :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7–143—73.07.06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

අංකය : විඅ/4/152.

අධ්‍යාපන අමාත්‍යාංශය

1973—ප්‍රංශ රජයේ ශිෂ්‍යත්ව

පහත සඳහන් ක්ෂේත්‍රයන්හි ඉගෙනීම සඳහා ප්‍රංශ රජය විසින් පිරිනමන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ :—

(1) ප්‍රංශ භාෂාව (ප්‍රථම උපාධි පාඨමාලාව),

(2) පුරා විද්‍යාව (පශ්චාත් උපාධි අධ්‍යයනය),

(3) ආර්ථික විද්‍යාව සහ සැළසුම් (බැංකු) (පශ්චාත් උපාධි අධ්‍යයනය),

(4) වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පුහුණුව.

ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

**සංලක්‍ෂය 1 :** රජයේ සේවකයන්ගෙන් අයදුම්පත් භාරගනු ලබන්නේ, ශිෂ්‍යත්වයෙන් ලැබෙන පුහුණුව දෙපාර්තමේන්තුවේ යම් කිසි ව්‍යාපාරයක් සම්බන්ධයෙන් අවශ්‍ය බවට ඔහුගේ/ඇගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අංක 514 හා 1960. 5. 16 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛය අනුව සහතික කරන්නේ නම් පමණය. එසේ කිරීමේදී, එම චක්‍ර ලේඛය යටතේ අවශ්‍ය විස්තරද දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය.

**සංලක්‍ෂය 2 :** මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින්ගේ අයදුම්පත්, ඒ ඒ ආයතනවල ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුයි. එවැනි අයදුම් පත් ඉදිරිපත් කිරීමේදී, අයදුම් පතේ 27 වැනි කොටුවේ සහතිකය ආයතන ප්‍රධානීන් ලවා යථා පරිදි සම්පූර්ණ කරවා එවිය යුතුය.

**සංලක්‍ෂය 3 :** එක් අයදුම්කරුවෙකු විසින් එවිය යුත්තේ එක් අයදුම් පතක් පමණය. ඉල්ලුම් කළ යුත්තේ ද එක් අධ්‍යයන පාඨමාලාවක් සඳහා පමණය.

2. **ශිෂ්‍යත්ව කාලය :** ශිෂ්‍යත්ව කාලය තෝරාගනු ලබන පාඨමාලාව මත රඳා පවතිනු ඇත. පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව සාමාන්‍යයෙන් අවුරුදු 2 ක කාල පරිච්ඡේදයක් සඳහා වන අතර වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් පශ්චාත් උපාධි පුහුණුව 6 මසක කාලයක් වන්නේ ය.

එහෙත් අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදැක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ ප්‍රංශ බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථාවක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේ ය.

3. **සුදුසුකම් :** අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුයි.

(ii) 1973. 9. 1 වැනි දිනට, වයස අවුරුදු 35 ට අඩුවිය යුතුයි.

(iii) (අ) **"ප්‍රංශ භාෂාව" පිළිබඳ පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන්නේ නම්**—දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ භාෂාව සහ තවත් නූතන භාෂාවක් සහිතව අ. පො. ස. (සා. පෙ.) විභාගයෙන් විෂයයන් 7 කින් සාමාර්ථයක්

**සහ**

පැරිසියේ "අලියොන්ස් ප්‍රැන්සේ" ආයතනයේ ඩිප්ලෝමා සහතිකය හෝ සමාන ඩිප්ලෝමා සහතිකයක් ලබා තිබිය යුතුය.

(ආ) **"පුරා විද්‍යා" පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන්නේ නම් :** පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් "පුරා විද්‍යාව" විෂයයක් වශයෙන් ඇති උපාධියක් හෝ පුරා විද්‍යාව සම්බන්ධ ඊට සමාන හෝ උසස් සුදුසුකමක් තිබිය යුතුය.

(ඉ) **"ආර්ථික විද්‍යාව හා සැළසුම් (බැංකු)" පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන්නේ නම් :** බැංකු ක්‍රම විශේෂ විෂය සහිතව ආර්ථික විද්‍යා ගෞරව උපාධියක් ලබා තිබිය යුතුය.

(ඊ) **"වෛද්‍ය විද්‍යාව සඳහා වූ පශ්චාත් උපාධි පුහුණුව" සඳහා ඉල්ලුම් කරන්නේ නම් :** ආචාර්ය උපාධියක් (Ph.D.) ඇති කථිකාචාර්යවරුන් විය යුතුය.

**සංලක්ෂ්‍යය : 1** ශ්‍රී ලංකා ජන රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ ශ්‍රී ලංකා ජන රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාලසීමාවේ සේවය සම්පූර්ණ කොට 1973. 9. 1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

**සංලක්ෂ්‍යය 2 :** එසේම, තාවකාලික තනතුරු දරන හෝ ස්ථිර තනතුරු දරන නමුත් තනතුරේ ස්ථිර කරනු නොලැබූ රජයේ සේවකයන් ද, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් ඉල්ලා අස්වීමට කැමැති නම් මිස, අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය. එසේ අස්වීමට කැමති නම්, ඒ බව අයදුම් පතේ 15(ඊ) කොටුවේ නිශ්චිත වශයෙන් සඳහන් කළ යුතුය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන් :** ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුලත් ය :—

(1) ප්‍රංශයට යාම සහ ආපසු ඒම සඳහා ගමන් පහසුකම්,

(2) මසකට ප්‍රෑන්ක් 750 ක දීමනාවක් (ප්‍රංශ භාෂාව පිළිබඳ ශිෂ්‍යත්වධාරීන් සඳහා මසකට ප්‍රෑන්ක් 500 ක දීමනාවකි),

(3) ඉගෙනීම සඳහා අවශ්‍ය උපකරණ හා පොත් මිළදී ගැනීමට යන වියදම් දැරීම් වස් දීමනාවක්.

**සංලක්ෂය :** මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නිතිරීතීන්ට යටත් වන්නේ ය.

5. **සම්මුඛ පරීක්ෂණය :** සුදුසුකම් ලත් අයදුම්කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතුය.

6. **ගිවිසුම:** තෝරාගනු ලබන අපේක්ෂකයන් ප්‍රංශය බලා පිටත්ව යාමට පෙර —

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්ව සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, ශ්‍රී ලංකා ජන රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාල සීමාවක් තුළ ශ්‍රී ලංකා ජනරජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයට හා ප්‍රදාන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියළුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම්) ශ්‍රී ලංකා ජන රජයට ආපසු ගෙවීමට ද, පොරොන්දුවන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

7. **වෛද්‍ය පරීක්ෂණය :** තෝරාගනු ලබන අපේක්ෂකයන් ප්‍රංශය අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට ද ශ්‍රී ලංකා ජන රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේ ය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට ශ්‍රී ලංකා ජන රජය පොරොන්දු නොවන්නේ ය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරැදි ප්‍රකාශයක් කර ඇති බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදානය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්ෂකයෙකු තෝරා ගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාම යෝජනා කිරීමෙන් පසු ප්‍රදානයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් ගතවන තුරු අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදානයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ශ්‍රී ලංකා අධිකාරීන් විසින් නාම යෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදාන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදු වන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන් දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබා ගැනීමට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේ ය.

13. මේ නිවේදනයේ හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතා වන් සියල්ල සෑම ආකාරයෙන් සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙළ කළ යුතු අයදුම් පත්, 21. 7. 73 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10 ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේ ය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන් කොට ඇති කොටුවේ රුපියල් 10 ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කළ යුතුය.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්වවිද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතුයි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද, මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සේවය කරන නිලධාරීන් අදාල අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මාර්ගයෙන් තම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7 ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දැන්වීමක් නොලදහොත්, ඒ බව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම්කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම ඔහුට අහිමි වන්නේ ය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූනි මස 26 වැනි ද,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

7–110—73.07.06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### රජයේ පාසල්වල විද්‍යාව/ගණිතය ඉගැන්වීම සඳහා දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ විද්‍යා උපාධිධාරී උපගුරුවරුන් බඳවා ගැනීම

රජයේ පාසල්වල විද්‍යා/ගණිත උපගුරු තනතුරු සඳහා ශ්‍රී ලංකා ජනරජයේ විශ්ව විද්‍යාලයක විද්‍යා උපාධිය හෝ ඊට සමාන සුදුසුකම් ලත් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව ඉල්ලුම් පත්‍ර පිළියෙළ කොට 1973 අගෝස්තු මස 6 වැනි දින, හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ, පාසල් පරිපාලන ශාඛාවේ, අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "විද්‍යා උපාධිධාරී උපගුරු තනතුරු" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය. දැනට රජයේ සේවයේ සිටින ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයක විද්‍යා උපාධිය දරන අය ද මේ සඳහා ඉල්ලුම් කළ හැක.

2. **සේවයේ යෙදීමේ නියමයන් හා සේවා කොන්දේසි :—**

(අ) (i) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය.

(ii) පත් කරනු ලබන අපේක්ෂකයින් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) පරීක්ෂණ කාලය අවුරුදු තුනකි.

(iv) පත්වීමක් ලබන්නා විසින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂයෙන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධානයන් ක්‍රියාවේ යෙදවීම සඳහා ද සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කෙරෙන යම් යම් ව්‍යවස්ථාවන්ට අනුකූලව ද ක්‍රියා කළ යුතුය.

(v) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල් රෙගුලාසි, පරිපාලන හා ආයතන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධානයන් රෙගුලාසි සහ රජය විසින් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

(ආ) පත් කිරීම සඳහා තෝරා ගනු ලැබුවන් විසින් තමා පත් කරනු ලැබූ අධ්‍යාපන දිස්ත්‍රික්කයේ, පාසල් අතුරින් නියම කරන ලද පාසලක සේවය කළයුතු අතර, මොනම හේතුවක් නිසාවත් එම දිස්ත්‍රික්කයෙන් බැහැරට ස්ථාන මාරුවක් සඳහා ඉල්ලුම් කිරීමට හිමිකම් නොමැත. එහෙත් විනයානුකූල හේතුන් හා දෙපාර්තමේන්තු අවශ්‍යතාවයන් නිසා ස්ථාන මාරුවීම කිරීමට දෙපාර්තමේන්තුවට ඇති අයිතිවාසිකමට මෙයින් අවහිරයක් නොවනු ඇත.

3. මෙම තනතුරු සඳහා නියමිත වැටුප් ක්‍රමය මෙසේ ය :—

ඒකාබද්ධ වැටුප—වාර්ෂික.

(ii) ගෞරව උපාධිය සඳහා—රු. 5,736—$6 \times 144$—$8 \times 180$—$1 \times 240$—රු. 8,280. (කා. ක. ඉ.—රු. 7,860 ට පෙර අධ්‍යාපන ඩිප්ලෝමා.)

(ii) ගෞරව උපාධිය සඳහා—රු. 5.736—$6 \times 144$—$8 \times 180$—$3 \times 240$—රු. 8,760. (කා. ක. ඉ.—රු. 8,520 ට පෙර අධ්‍යාපන ඩිප්ලෝමා.)

විවාහක දීමනාව නියමිත ප්‍රමාණයන්ට අනුව ගෙවනු ලැබේ.

4. අවශ්‍ය සුදුසුකම් :—

සෑම අයදුම්කරුවකු විසින්ම ඔහු/ඇය පහත සඳහන් කරුණුවලින් යුක්ත වන බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කර සිටිය යුතුය :—

(අ) විශිෂ්ඨ චරිතයකින් හා මනා ශාරීරික සෞඛ්‍ය තත්ත්වයකින් ද යුක්තව සිටින බව.

(ආ) 1973 අගෝස්තු මස 6 වැනි දිනට වයස අවුරුදු 18 ට අඩු හෝ අවුරුදු 35 ට වැඩි හෝ නොවන බව. (දැනට රජයේ සේවයේ නියුක්ත වූවනට මෙම වයස් සීමාව අදාල නොවේ.)

(ඉ) පහත සඳහන් සුදුසුකම් හෝ ඊට වැඩි අධ්‍යාපන සුදුසුකම් තිබිය යුතුය :—

(i) ශුද්ධ ගණිතය, ව්‍යවහාර ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සත්ව විද්‍යාව හා උද්භිද විද්‍යාව යන විෂයයන් ගෙන් තුනක් සහිතව ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයක විද්‍යා උපාධිධාරියෙකු බව.

හෝ

(ii) ශුද්ධ ගණිතය, ව්‍යවහාර ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, සත්ව විද්‍යාව හා උද්භිද විද්‍යාව යන විෂයයක් සහිතව ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයක විද්‍යා ගෞරව උපාධිධාරියෙකු වීම ;

සහ

(iii) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී හෝ අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ දී සිංහල /දෙමළ භාෂාවට සාමාර්ථය ලබා සිටීම.

(ඊ) තමන් පදිංචිය දක්වා ඇති ඡන්ද කොට්ඨාශයේ ස්ථිර පදිංචිකරුවෙකු බව පහත සඳහන් කුමන හෝ එක් ආකාරයකින් ඔප්පු කිරීමට අයදුම්කරු සමත් විය යුතුය :—

(i) ඡන්ද කොට්ඨාශයේ උපන් බව උප්පැන්න සහතිකය මගින්,

(ii) ඡන්ද කොට්ඨාශයේ පිහිටි පාසලකින් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයට හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයට ඉදිරිපත්වූ බව. (ජ්‍යෙෂ්ඨ සහතිකය හෝ අ. පො. ස. සාමාන්‍ය සහතිකය මගින්).

(iii) ඡනද් කොට්ඨාශයේ ලියාපදිංචි ඡන්ද දායකයෙකු බව. ඡන්දදායක ලේඛනයක සහතික කළ උධෘතයක් මගින්.

(iv) අයදුම්කරුගේ දෙමාපියන් ඡන්ද කොට්ඨාශයේ ස්ථිර පදිංචිකරුවන් වීමත් සමග පසුගිය අවුරුදු 3 ඇතුළත ස්ථිර පදිංචිකරුවෙකු බව ගෘහ මූලික ලැයිස්තුව මගින්.

(උ) අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඔවුන්ගේ ඉල්ලුම් පත්වලට අමුණා එවිය යුතුය :—

(i) උප්පැන්න සහතිකය.

(ii) අධ්‍යාපන සහතික.

(iii) මෑතදී ලබාගත් චරිත සහතික දෙකක්.

**සටහන :** ඉහත සඳහන් ලියවිලිවල පිටපත් අමුණා එවීමට අපොහොසත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5. ඉල්ලුම් පත්‍ර සහ අනිකුත් අදාළ ලියකියවිලි මෙම නිවේදනයේ 1 වැනි ඡේදයේ පරිදි එවිය යුතු අතර, අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුවල කිසිම නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

6. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (IIඅ) ඡේදයේ ආරම්භයේ දක්වෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් පොදු කොන්දේසි බලනු මැනවි.

7. ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන ඉල්ලුම් භාර ගනු නොලැබේ.

8. තැපැලේදී සිදුවිය හැකි කවර ප්‍රමාදයක් හෝ මග හැරවීම සඳහා සිය ඉල්ලුම් පත් කල් වේලා ඇතිව ලියාපදිංචි තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම්කරුවන් වෙත මෙයින් දනුම් දෙනු ලැබේ.

පී. උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්
හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1973 ජූනි මස 26 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

### ආදර්ශ අයදුම් පත්‍රය

#### දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ රජයේ පාසැල්වල විද්‍යා උපාධිධාරී උපගුරු බඳවා ගැනීම

1. මුලට පෙළපත් නම සහිත සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. (i) ස්ථිර ලිපිනය :————.
 (ii) ඡන්ද කොට්ඨාශය :————.

3. ඡන්ද දායකයකු වශයෙන් ලියාපදිංචි වී ඇත්නම් අදාළ ඡන්ද දායක කොට්ඨාශය :————.

4. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

5. ඉල්ලුම්කරු අ. පො. ස. (සාමාන්‍ය පෙළ) විභාගයට ඉදිරිපත් වූ පාසල :————.

6. විවාහක ද, අවිවාහක ද යන බව :————.

7. උපන් දිනය හා ස්ථානය :————.

8. 1973 අගෝස්තු 6 දිනට වයස :————.

9. (i) අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
 (ii) අයදුම්කරුගේ මව උපන් ස්ථානය :————.

10. ජාතිය :————.

11. ලාංකිකයෙකු වූයේ පරම්පරාවෙන් ද/ලියාපදිංචි වීමෙන් ද යන බව :————.

12. සුදුසුකම් :—

(අ) උපාධිය පිළිබඳ විස්තර :————.
(ගෞරව හෝ සාමාන්‍ය).

(ආ) පංතිය :————.

(ඉ) විශ්ව විද්‍යාලය :————.

(ඊ) උපාධිය ලැබූ වර්ෂය :————.

(උ) උපාධිය සඳහා ගත් විෂයයන් :————.

(ඌ) අන්තර් මධ්‍ය/විද්‍යා යෝග්‍යතා විභාගය සඳහා ගත් විෂයයන් :————.

(එ) භාෂා මාධ්‍යය :————.

13. සිංහල/දෙමළ භාෂාවෙන් ලබා ගත් උපරිම සුදුසුකම් :————.

14. අයදුම්කරු රජයේ සේවයේ නියුක්තව සිටියේ නම් ඒ සම්බන්ධ විස්තර පහත සපයන්න :—

(1) දෙපාර්තමේන්තුවේ නම :————.

(2) දරණ ලද තනතුර සහ එම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත ද යන බව :————.

(3) පත් වූ දිනය :————.

(4) අස් වූ දිනය සහ අස්වීමට හේතු :————.

(5) (i) ගුරුවරයෙක් නම් ලියාපදිංචි අංකය සහ අන්තිමට සේවය කළ/දැනට සේවය කරන පාසැල :————.

(ii) දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය :————.

(iii) පළමුවෙනි පත්වීම දිනය :————.

(iv) දැනට උගන්වන ශ්‍රේණිය හා විෂයයන් :————.

15. විශේෂ අයිතිවාසිකම් සුදුසුකම් හෝ පළපුරුද්ද පිළිබඳ විස්තර :————.

ඉහත සඳහන් කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මා රජයේ සේවයෙන් පහකර නොමැති බවත්, තනතුරු අත්හැර ගිය අයෙකු සේ සලකා නැති බවත්, මා පරම්පරාවෙන්/ලියාපදිංචි කිරීමෙන් ලාංකිකයෙකු බවත් වැඩිදුරටත් ප්‍රකාශ කරමි. මෙහි අන්තර්ගත කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව මා තෝරා ගැනීමට කලින් හෙළි වුවහොත් මා නුසුදුස්සකු කිරීමට යටත් බවත්, පත් කරනු ලැබුවායින් පසු සොයා ගතහොත් මා සේවයෙන් පහ කර දැමිය හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(අයදුම්කරු රජයේ දෙපාර්තමේන්තුවක හෝ සංස්ථාවක සේවය කරන්නේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ සංස්ථාවේ ප්‍රධානියා මගින් ඉල්ලුම් පත්‍ර එවිය යුතුයි).

................................ ගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකිය.

.................................................,
දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ ප්‍රධානියා හෝ ඒ වෙනුවට බලය ලත් නිලධාරියාගේ අත්සන.

තනතුර :................................................

ලිපිනය :................................................

දිනය :————.

7-140—73.07.06 දින අංක 67 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන අමාත්‍යාංශය

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති රජයේ සංගීත විද්‍යාලයේ විද්‍යාලාධිපති තනතුර

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති රජයේ සංගීත විද්‍යාලයේ විද්‍යාලාධිපති තනතුර **සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති** අයදුම්කරුවන්ගෙන් (ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම) ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙහි පහතින් පෙනෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත් 1973. 07. 21 දිනට හෝ ඊට පෙර කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (පාසල් පරිපාලන ශාඛාව) වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම් පත බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ රජයේ සංගීත විද්‍යාලයේ "විද්‍යාලාධිපති තනතුර" යනුවෙන් සඳහන් කළ යුතුය.

2. වර්ෂයකට රු. 11,040—480×11—රු. 16,320 යන **ඒකාබද්ධ** වැටුප් ක්‍රමය මෙම තනතුරට අයත් වේ. (1969. 10. 01 **දිනට ප්‍රථම** පැවති මෙයට අනුරූප වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 8,400—480×10 —රු. 13,200 වේ.) **විවාහක දීමනා නියමිත ප්‍රමාණයට අනුව ගෙවනු** ලැබේ.

3. **වයස් සීමාව.**—1973. 07. 21 දිනට වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 50 ට නොවැඩි විය යුතුය. (දැනට රජයේ සේවයේ නියුක්ත නිලධාරීන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)

4. මෙම තනතුරු ඉල්ලුම් කරන සෑම අයදුම්කරුවෙකු විසින්ම පහත දැක්වෙන සුදුසුකම් ඇති බවට පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

(i) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතුය.

(ii) (අ) දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව අංක ගණිතය/ගණිතය ඇතුළු විෂයයන් 6 කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ,

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ,

(ඇ) ඊට සම හෝ උසස් විභාගයකින් සමත් වී සිටිය යුතුය.

(iii) පෙරදිග සංගීතය පිළිබඳ පිළිගත් විශ්ව විද්‍යාලයක හෝ ආයතනයක උපාධියක් තිබිය යුතුයි.

(iv) අවුරුදු 10 කට අධික කාලයක් පෙරදිග සංගීතය පිළිබඳ ඉගැන්වීමේ පළපුරුද්දක් තිබිය යුතුය. එම ඉගැන්වීම රජයේ හෝ රජය පිළිගත් විද්‍යාලයක විය යුතුය.

(v) රජයේ හෝ රජය පිළිගත් සංගීත විද්‍යාලයක දස වර්ෂයකට අධික කාලයක් පාලනය පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුයි.

(vi) පෙරදිග සංගීතය, ගායනය හා වාදනය පිළිබඳ පුළුල් අවබෝධයක් තිබිය යුතුයි.

(vii) දේශීය ගායනය වාදන හා ජන ගායනා පිළිබඳ උසස් දැනීමක් තිබිය යුතුයි.

(viii) සංගීත නිබන්ධය හා රචනා කිරීමේ කුශලතාවයක් හා සමූහ ගායන, වාදන නිෂ්පාදනයෙහි පළපුරුද්දක් තිබිය යුතුය.

(ix) පෙරදිග සංගීතය පිළිබඳ පර්යේෂණ පැවැත්වීමේ හැකියාව තිබිය යුතුය.

(x) පෙරදිග සංගීතය හා ලංකා ඉතිහාසය පිළිබඳ පුළුල් දැනුමක් තිබිය යුතුය.

(xi) විවිධ සංගීත පද්ධති හා ශෛලී පිළිබඳ **අවබෝධයක් තිබිය** යුතුය.

**සටහන.**—(අ) විදේශීය සංගීත විද්‍යාලයක පුහුණුවක් ලබා තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

(ආ) පෙරදිග භාෂා පිළිබඳ දැනීම ද අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

5. **සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :—**

(i) මෙම තනතුර ස්ථිරය. පත්වීම අර්ථ සාධක අරමුදල් ක්‍රමය යටතේ වනු ඇත. පත් කරනු ලබන අය විසින් තමාගේ වැටුපෙන් 6% ක් අර්ථ සාධක අරමුදල් සඳහා දායක මුදල් වශයෙන ගෙවිය යුතු අතර රජය සියයට 9% ක් ඒ සඳහා ගෙවනු ඇත.

(ii) **පත්වීම සාමාන්‍ය වශයෙන් 3 අවුරුදු ආධුනික කාල සීමාව කට යටත් වේ. දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියෙකු තෝරා ගනු ලැබුව හොත් ඔහු අවුරුදු 1 ක කාල සීමාවක් වැඩ බැලීමේ පදනම මත පත් කරනු ඇත.**

(iii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීම සඳහාත්, විශේෂයෙන්ම වර්ෂ 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහාත් දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන්ම මින්මතු පනවනු ලබන ව්‍යවස්ථා වලට ද තෝරා පත් කරනු ලැබුවන් අනුකූල විය යුතුයි..

6. රජයේ සේවයේ නියුක්ත සුදුසුකම් ලබා ඇති අයදුම් කරුවන් තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් අයදුම් පත් ඉදිරිපත් කළ යුතුය. ඉහතින් සඳහන් දිනට පසුව එවන අයදුම් පත් භාරගනු නො ලැබේ. එහෙත් දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට නියම අවසානවේ ලැබී ප්‍රමාදය සඳහා සැලකිය යුතු කාරණයක් ඉදිරිපත් කළහොත් පමණක් ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම් පත් භාරගනු ලැබේ.

7. අයදුම්කරුවන් විසින් පහත දැක්වෙන ලියවිලිවල පිටපත් (මුල් පිටපත් නොවේ.) ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

(අ) උප්පැන්න සහතිකය.(බෞතිස්ම සහතිකය හෝ පාඨශාලා වලට ඇතුළත් වීම සඳහා උපකෘත පාඨශාලා ව්‍යවස්ථාවනට අනුව නිකුත් කළ උප්පැන්න සහතිකය හෝ භාරගනු නො ලැබේ.)

(ආ) ලබා ඇති උසස්ම අධ්‍යයන හා වෘත්තීය සුදුසුකම් දැක්වෙන සහතික.

(ඇ) අයදුම්කරුවන්ගේ චරිතය පිළිබඳ මෑතක දී ලබාගත් චරිත සහතික තුනක්.

(දැනටමත් රජයේ සේවයේ නියුක්ත නිලධාරීන් සඳහා මෙය අවශ්‍ය නොවේ.)

8. ඉල්ලුම් පත්‍ර හා අනෙකුත් ලියවිලි මෙම අමාත්‍යාංශයේ කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නො එවිය යුතුය.

9. මෙම ගැසට් පත්‍රයේ I කොටසේ (IIඅ) ඡේදයේ ආරම්භයේ දැක්වෙන රාජ්‍යසේවා තනතුරු වලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධව පොදු කොන්දේසි ද බලනු මැනවි.

පී. උඩගම,
**අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.**

1973 ජූනි මස 27 වැනි දින,
කොළඹ 2 මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

### ආදර්ශ ආකෘති පත්‍රය

අධ්‍යාපන අමාත්‍යාංශයේ රජයේ සංගීත විද්‍යාලයේ විද්‍යාලාධිපති තනතුර

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
(පැහැදිලි අකුරෙන්)

2. ලිපිනය :————.

3. ජාතිය :————.
(ලාංකික වන්නේ (අ) පරම්පරාවෙන් ද (ආ) ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලංකාවේ පුරවැසියකු වන්නේ ලියාපදිංචි කිරීමෙන් නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැඳහුම් අංකයත් සඳහන් කරන්න.)

4. (අ) උපන් දිනය :—අවුරුද්ද :——, මාසය :——, දිනය :——
(ආ) අයදුම් පත් භාර ගන්නා අවසාන දිනට නියම වයස :—
අවුරුදු :——, මාස :——, දින :——.

5. උපන් ස්ථානය :————.
(අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ සීයා :————.
(ඈ) අයදුම්කරුගේ සීයාගේ පියා :————.

6. චරිත සහතික ලබා දුන් අයගේ නම් හා ලිපිනයන් :————.

7. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයන් සමඟ :————.
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.
(ඇ) ඉංග්‍රීසි :————.

8. සිංහල භාෂාවෙන් ඉගැන්වීමට හා වාර්තා හැදීමට හැකියාව තිබේද යන වග :————.

9. පාසැලෙන් අස්වූ දින් සිට කරන ලද රැකියා සම්බන්ධ විස්තර :—

| දෙපාර්තමේන්තුව | දරූ තනතුර | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

10. ලබාගෙන ඇති වෘත්තීය සුදුසුකම් පිළිබඳ විස්තර :—

**සුදුසුකම් ලැබූ දිනය** **ආයතනයේ නම**

11. මෙම තනතුර සඳහා හිමිකම් සනාථ කිරීමට අදාල වියහැකි වෙනත් සුදුසුකම් ලබා ඇත්නම් ඒ පිළිබඳ විස්තර :

————.

මා විසින් ඉහත සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මෙහි අඩංගු යම්කිසි කරුණක් අසත්‍ය හෝ වැරදි බව සොයා ගනු ලැබුව හොත්, තෝරීමට කලින් මා නුසුදුසු වීමටත්, පත්වීමෙන් පසු එම ප්‍රමාද දෝෂය අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමටත්, මා යටත් වන බව ද දනිමි.

————,

**අයදුම්කරුගේ අත්සන.**

දිනය :————.

**7-155—73.07.06 දින අංක 67 දරන ගැසට් පත්‍රය**

---

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

නිලධාරීන්ගේ තනතුරු සඳහා ඇබෑර්තු

ශ්‍රී ලංකා නාවික හමුදාවේ විධායක අංශයේ නිලධාරි තනතුරු සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට ශ්‍රී ලංකා නාවික හමුදා නිත්‍ය බලකායේ **උප ලුතිනන් නිලයේ ස්ථිර අධිකාරී ලබාදෙනු** ඇත.

3. **තෝරා ගනු ලබන අපේක්ෂකයින් ශ්‍රී ලංකාවේ/එතෙර අභ්‍යාස** පාඨමාලා හැදෑරීමට අවශ්‍ය වේ.

4. **සුදුසුකම්.**— අයදුම්කරුවන්—

(අ) **ශ්‍රී ලංකා පුරවැසියන් විම.**

(ආ) අවිවාහක විය යුතු අතර 1973 අගෝස්තු මස 06 වැනි දිනට වයස අවුරුදු 18 අඩු නොවිය යුතු අතර අවුරුදු 24 ට වැඩි නොවිය යුතුය.

(ඇ) (i) පහත සඳහන් විෂයයන් 2 කින් සම්මාන සහිතව අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණය සමර්ථ වී සිටීම.

| | |
|---|---|
| ශුද්ධ ගණිතය | රසායන විද්‍යාව |
| ව්‍යවහාර ගණිතය | උද්භිද විද්‍යාව |
| භෞතික විද්‍යාව | සත්ව විද්‍යාව, හෝ |

(ii) ඉහත සඳහන් විෂයයන් සහිතව උසස් අධ්‍යයන සහතිකයක් සතුව තිබීම.

**සටහන :** (1)—**ක්‍රීඩා පිළිබඳ විශිෂ්ඨත්වයන් දක්වනු ලැබූ අපේක්** ෂකයින් කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(2) දක්වා ඇති අධ්‍යාපනික සුදුසුකම් හෝ වෙනත් උසස් සුදුසුකම් ඇතොත්, ඉහත 4 (අ) සහ (ආ) ඡේදවල සඳහන් සුදුසුකම් ඇති ස්වේච්ඡා නාවික බලකායේ නිල ධාරීන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ඈ) වෛද්‍ය තත්ත්වය—නාවික හමුදාවට අවශ්‍ය වන පරිදි සෞඛ්‍ය තත්ත්වයට අපේක්ෂකයින් **යෝග්‍යව සිටිය යුතු** අතර, පත්වීමට පෙර නාවික පිළියෙල කිරීමකින් පැවැත් වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමර්ථ විය යුතුය.

5. **වැටුප් හා දීමනා.**—නාවික හමුදා වැටුප් සංග්‍රහයෙහි සඳහන් පරිදි නිලයට නියමිත වැටුප් හා දීමනා තෝරා ගනු ලබන අපේක් ෂකයින්ට පත්වීමේ දී ගෙවනු ලැබේ.

(අ) කොමාන්ඩර් නිලයේ නිලධාරීන් දක්වා සන්නද්ධ සේවා වැටුප් කමිටුව මගින් ගෙවීමට නිර්දේශ කර ඇතට ගෙවනු ලබන ඒකාබද්ධ වැටුප් පරිමාණයන් පහත සඳහන් අයුරිනි :—

**උප ලුතිනන්**—වර්ෂයකට රුපියල් 7,500 න් පටන්ගෙන අවුරුදු පතා රුපියල් 180 වැඩිවීම් 5 කින් යුතුව රුපියල් 8,400 දක්වා

**ලුතිනන්—වාර්ෂිකව රුපියල් 9,240 න් පටන්ගෙන** අවුරුදු පතා රුපියල් 180 වැඩිවීම් 8 කින් යුතුව රුපියල් 10,680 දක්වා

**ලුතිනන් කොමාන්ඩර්**—වාර්ෂිකව රුපියල් 11,400 න් පටන්ගෙන අවුරුදු පතා රුපියල් 240 වැඩිවීම් 8 කින් යුතුව රුපියල් 13,320 දක්වා

**කොමාන්ඩර්**—වාර්ෂිකව රුපියල් 15,000 න් පටන්ගෙන අවුරුදු පතා රුපියල් 360 වැඩිවීම් 7 කින් යුතුව රුපියල් **17,520 දක්වා**

(ආ) පහත සඳහන් දීමනා ද ගෙවනු ලැබේ.

(i) නාවික වැටුප් සංග්‍රහයෙහි සලසා ඇති පරිදි සුදුසුතා වැටුප් ගෙවනු ලැබේ.

(ii) පහත සඳහන් පරිදි නිල ඇඳුම් දීමනා ගෙවනු ලැබේ. සර්ම කලාපීය නිල ඇඳුම් සඳහා මූලික දීමනාවක් **වශයෙන් රුපියල් 1,000 ක් මීට අමතරව මසකට** රු. 25 බැගින් නිල ඇඳුම් නඩත්තු කිරීමේ දීමනාවක්.

(iii) **අනිකුත් දීමනාවන්**—විවාහක නම්, ආණ්ඩුවේ පරිමාණ යන් අනුව විවාහක දීමනාවක් ගෙවනු ලැබේ. වෙන් **වී සිටීමේ දීමනාව, සහ අනුගාමික දීමනාවන් නාවික** වැටුප් සංග්‍රහයෙහි සඳහන් පරිදි ගෙවනු ලැබේ.

6. **සේවා කොන්දේසි.**—

(අ) කලින් කල සංශෝධනය කරනු ලැබූ 1950 දෙසැම්බර් 9 වැනි දින **අංක 10,187 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ** කරන ලද නිලධාරීන්ගේ රෙගුලාසි අනුව සේවා කොන් **දේසි පාලනය වේ.**

(ආ) **තෝරාගනු ලබන අපේක්ෂකයින් අර්ථසාධක අරමුදලට හිමි කරුවන් වන අතර, රජය මගින් නිගමනය කරනු ලබන පරිදි රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට සිය වැටුපෙන්** සියයට ප්‍රමාණයක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය. විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු නොලැබේ. කෙසේ වුවද, ශිෂ්‍ය භටයෙකු වශයෙන් පත්වීමට පෙර දින ශ්‍රී ලංකා ජනරජයේ විශ්‍රාම වැටුප් හිමිකම් සහිත තනතුරක් දරණ ලද්දේ නම් කලින් කල සංශෝධනය කරනු ලැබූ 1962 දෙසැම්බර් 7 දින අංක 13,423 දරණ ගැසට් පත්‍රයේ පළ **කරනු ලැබූ 1962 නාවික හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහයට අනුකූලව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ඇත.**

(ඇ) ශ්‍රී ලංකා නාවික හමුදා නිලධාරීන් රාජකාරිය සඳහා හෝ පුහුණුව සඳහා ඕනෑම විටක ලෝකයේ කුමන කොටසකට වුවත් පිටත්කර යැවිය හැක.

(ඈ) නව ප්‍රවේශකයින් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙද **වීමත්, විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා** පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පනවා ඇති මෙන්ම ඉදිරියටත් පනවනු ලබන ව්‍යවස්ථාවලට අනුකූලව ක්‍රියා කිරීමට අවශ්‍ය වේ.

7. **අයදුම්කරුවන්ට උපදෙස්.**—1973 අගෝස්තු මස 06 වැනි දිනට පෙර මෙම දැන්වීමෙහි දැක්වන ආකෘති පත්‍රය අනුකූලව අයැදුම් පත් කොළඹ, තැ. පෙ. 593, නාවික හමුදා මූලස්ථානයේ, නාවික හමුදාපතිට ලැබෙන සේ ඉදිරිපත් කළ යුතු වේ. "නිලධාරී පුරප්පාඩු" යන්න ඉල්ලුම්පත් අඩංගු කවරයේ සටහන් කළ යුතුයි. අයැදුම් පත් ලැබුණු බව දන්වා එවනු ලැබේ.

8. රජයේ සේවයේ හෝ සංස්ථාවල සේවයෙහි යෙදී සිටින නිල ධාරීන් **දෙපාර්තමේන්තු සංස්ථා ප්‍රධානීන් මගින් ඉල්ලුම් කළ** යුතු අතර, තෝරා ගනු ලැබුවහොත් නිලධාරියා මුදා හැරිය හැකි බවට සහතිකයක් ඉල්ලුම් පතෙහි අඩංගු විය යුතුය.

9. ඉල්ලුම්පත් සමග එවිය යුතු පිටපත්—

(අ) උප්පැන්න සහතිකය

(ආ) කියා සිටින අධ්‍යාපනික සුදුසුකම් සහතික

(ඇ) යටත් පිරිසෙයින් අයැදුම්කරු පුද්ගලිකව හඳුනන වගකිවයුතු පුද්ගලයින් දෙදෙනෙකුගෙන් ලබාගත් චරිත සහතික දෙකක්

10. ඉහත සඳහන් කොන්දේසි සපුරාලන **අයැදුම්කරුවන්ගෙන්** මූලික තෝරාගැනීම කරනු ලැබේ. **මූලික සම්මුඛ පරීක්ෂණයේ දී තෝරාගනු ලබන අපේක්ෂකයින්ගෙන් නාවික සේවය සඳහා යෝග්‍ය** තාවය පරීක්ෂාකර බැලීමේ විශේෂ කෞශල්‍ය පරීක්ෂණයට පෙනී සිටීම අවශ්‍ය වේ. ඉන්පසු තෝරාගනු ලබන අපේක්ෂකයින්, රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන තෝරා ගැනීමේ මණ්ඩලයක් විසින් අවසාන තෝරා ගැනීම සිදු කෙරේ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන ස්ථානය, දිනය හා වේලාව ලියා දන්වනු ලැබේ. මෙම කරුණ වෙනුවෙන් ගමන් වියදම් ලංකාණ්ඩුව මගින් නොගෙවනවා ඇත.

ඩී. බී. ගුණසේකර,
කොමදෝරු,
වැඩබලන නාවික හමුදාධිපති.

1973 ජූනි 27 දා,
කොළඹ,
ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානයේ දී ය.

ශ්‍රී ලංකා නාවික හමුදාව—නිලධාරි තනතුර සඳහා අයදුම් පත

1. සම්පූර්ණ නම (ඇංගලීසි අකුරෙන්) :————.

2. ජාතිය (ලංකා පුරවැසි භාවය පරම්පරාවෙන් ද, නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද යන්න හා ලියාපදිංචි වීමෙන් නම් සහතිකයේ අංකය හා දිනය සඳහන් කරන්න):————.

3. ලිපිනය:————.

4. උපන් දිනය:————.

**1973 අගෝස්තු මස 06 දිනට වයස :——, අවුරුදු :——, මාස :——, දින :——.**

5. ආසන්න පොලිස් ස්ථානය :————.

6. ඡන්ද කොට්ඨාශය:————.

7. දෙමාපියන්ගේ නම්, උපන් ස්ථාන හා වර්තමාන ලිපිනයන් :

| | සම්පූර්ණ නම | උපන් ස්ථානය | ලිපිනය |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

8. ඔබ විවාහක ද, අවිවාහක ද යන වග:————.

9. ඔබ පාසලේ දී ලත් ක්‍රීඩා පිළිබඳ විශිෂ්ඨ සම්මාන මොනවාද ? :————.

10. ඔබ පාසැලේ දී ලබා ඇති වෙනත් විශේෂ දක්ෂකම් මොනවාද?:————.

11. මීට පෙර සන්නද්ධ සේවාවක, ස්වේච්ඡා භට කණ්ඩායමක, ශිෂ්‍ය භට කණ්ඩායමක හෝ බාලදක්ෂ ව්‍යාපාරයක කර ඇති සේවය:————.

12. මෙම පත්වීම සඳහා ඔබ සතුව ඇති වෙනත් විශේෂ සුදුසුකම් මොනවාද?:————.

13. මීට පෙර කිනම් හෝ සන්නද්ධ සේවාවක ඇබෑර්තුවක් සඳහා ඔබ අයදුම් කර තිබේද? එසේ නම් එහි ප්‍රතිඵල :————.

14. ඔබගේ පාසැල් කාලය පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :————.

| විද්‍යාලයේ නම | දිනය | | සමත් වූ ආණ්ඩුවේ විභාග සහ විෂයයන් |
|---|---|---|---|
| | ඇතුළුවීම | අස්වීම | |
| | | | |

15. විද්‍යාලයෙන් අස්වූවාට පසු නියුක්තව සිටි රැකියාවන් පිළිබඳ පහත සඳහන් විස්තර සපයන්න :—

| ස්වාමියාගේ නම | රැකියාවේ ස්වභාවය | සේවාකාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |

16. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ ලිපිනයන් :————.

(අ) ————.

(ආ) ————.

ඉහත සඳහන් ප්‍රශ්නවලට මා විසින් සපයා ඇති පිළිතුරු මගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. ගැසට් පත්‍රයෙහි පළ කර ඇති පරිදි ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිලධාරි තනතුරු සඳහා තෝරා ගනු ලබන අපේක්ෂකයින් කෙරෙහි බලපාන ව්‍යවස්ථා වෙන්ම, නිලධාරීන්ගේ වැටුප් හා සේවා කොන්දේසි සහ උසස්වීමේ හැකියාවන් කෙරෙහි බලපාන සේවා කොන්දේසි ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7-108—73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**රජයේ ගණකාධිකාරි සේවයේ IV වැනි පංතියට පත්කිරීමේ සීමිත තරඟ විභාගය—1973**

1973 ජූනි මස 08 වැනි දින අංක 63 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටස (IIඅ) වැනි ඡේදයේ පළ කරන ලද යථෝක්ත විභාගය සම්බන්ධයෙන් වූ නිවේදනය කෙරෙහි අපේක්ෂකයින්ගේ අවධානය මෙයින් යොමු කරනු ලැබේ.

එම ගැසට් නිවේදනයට පහත දැක්වෙන සංශෝධනයන් එක් කරනු ලැබේ :—

2. **විභාගයට ඉල්ලුම් කළයුතු පිළිවෙල.**—(අ) මෙම විභාගය සඳහා මුද්‍රිත අයදුම්පත් **විභාග කොමසාරිස් විසින් නිකුත් කරනු නො** ලැබේ. මෙම නිවේදනයේ අවසානයෙහි දැක්වෙන ආදර්ශ අයදුම් පත්‍රය අනුව අපේක්ෂකයින් විසින් අයදුම්පත් සකස් කරගත යුතුය. මේ සඳහා අඟල් $8\frac{1}{2} \times 12$ ප්‍රල්ස්කැප් ප්‍රමාණයේ තනි කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත් සකස් කර ගත යුතුය.

(ආ) මෙම විභාගය සඳහා ගාස්තුව **රුපියල් සියයකි.** ඉම් සඳහා ගාස්තු ආදායම් ශීර්ෂය 6 උප ශීර්ෂය 2 විෂයය 5 ට බැර කරන ලෙසට උපදෙස් සහිතව ඉල්ලුම් පත්‍රය භාරගන්නා අවසාන දිනට ප්‍රථම ලගම ඇති කච්චේරියට හෝ කොළඹ මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතුය. **කච්චේරියෙන් හෝ කොළඹ මහා භාණ්ඩාගාරයෙන් ලබා** ගත් කුවිතාන්සිය තම ඉල්ලුම් පත්‍රයට ඇලවිය යුතුය.

(ඇ) නිසි ලෙස සම්පූර්ණ කරනු ලබන අයදුම්පත් විභාග කොමසාරිස්, තැ. පෙ. 1503, කොළඹ 2, යන ලිපිනයට 1973 ජූලි මස 21 වැනි දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලේඛනගත තැපෑලෙන් යැවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත් තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් යැවිය යුතුය. අයදුම්පත් විභාග කොමසාරිස්ගේ හෝ එම දෙපාර්තමේන්තුවේ අන්‍ය නිලධාරියෙකුගේ පෞද්ගලික ලිපිනයට නො යැවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ උඩ කෙළවරේ "රජයේ ගණකාධිකාරී සේවයට බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය" යනුවෙන් ද සඳහන් කළ යුතුය.

(ඉ) අයදුම්පත් ලැබුණු බව විභාග කොමසාරිස් විසින් අපේක්ෂකයින්ට දන්වනු ලැබේ. තම අයදුම්පත ලැබුණු බව අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත දැනුම් දෙනු නොලැබුවහොත් ඔහු විසින් ඒ බව වහාම විභාග කොමසාරිස් වෙත දැනුම් දිය යුතුය. එසේ විමසා නොබැලීමෙන් සමහර විට විභාගයට පෙනී සිටීමේ අවස්ථාව අයදුම්කරුට නොලැබී යාමට ද ඉඩ ඇත.

5. **අයදුම්කරුවන්ගේ සුදුසුකම්.**—(ඇ) (1) සහ (2) හි දැක්වෙන යෝග්‍යතාව ලැබීමේ, රජය යටතේ සේවා කාලය ගණන් ගැනීම 1973 ජූලි මස 21 වැනි දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

8. **තෝරා ගන්නා ක්‍රමය.**—(1) ලිඛිත පරීක්ෂණයක් ද, (2) සම්මුඛ පරීක්ෂණයක් ද යන වශයෙන් කොටස් දෙකකින් යුක්ත වූ තරඟ විභාගයක් පවත්වනු ලැබේ. ලිඛිත පරීක්ෂණය 1973 අගෝස්තු මස 23, 24 සහ 25 වැනි දිනයන්හිදී කොළඹදී පවත්වනු ලැබේ. ලිඛිත පරීක්ෂණයෙන් පසුව අයදුම්කරුවන්ට දැනුම්දෙනු ලබන දිනයක සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේදි සෑහෙන උසස් තත්ත්වයක් ලබාගන්නා අයදුම්කරුවන්ට පමණක් මෙම සම්මුඛ පරීක්ෂණය සීමාවනු ඇත.

1973 ජූනි මස 08 වැනි දින අංක 63 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පලකරන ලද මෙම විභාගය සම්බන්ධයෙන් වූ නිවේදනයේ අනිකුත් කරුණු සහ කොන්දේසි එසේම බල පැවැත්වේ.

පී. එච්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූනි මස 27 වැනි දින,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව,
ටොරිංටන් චතුරශ්‍රය, කොළඹ 7.

ආදර්ශ අයදුම් පත්‍රය

**ගණකාධිකාරි සේවයේ iv වැනි පන්තියට පත්කිරීමේ සීමිත තරඟ විභාගය—1973**

විභාග අංකය :
(කාර්යාලයීය ප්‍රයෝජනය පිණිසයි)

1. (i) මුලකුරු සමඟ අගට යෙදෙන නම :————.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

2. සම්පූර්ණ ලිපිනය :————.

3. ස්ත්‍රී පුරුෂ භාවය :————.

4. ඔබ ලංකාවේ පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන්ද නැත හොත් ලියාපදිංචි කිරීමෙන්ද :————.

5. විභාගයට පෙනී සිටින මාධ්‍යය :—

(i) පොත් තැබීම සහ ගණකාධිකරණය :
(ii) ගිණුම් :
(iii) ව්‍යාපාරික ගණිතය :
(iv) පිරිවැය ගණකාධිකරණය :
(v) ආර්ථික විද්‍යාව සහ රාජ්‍ය මුදල් :
(vi) ආණ්ඩුවේ මූල්‍ය රෙගුලාසි සහ මූල්‍ය කාර්ය පරිපාටිය:

6. ව්‍යවස්ථා 5 ඇ (ii) යටතේ ඉදිරිපත් වන අයදුම්කරුවන්ට පමණයි.

(i) මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුවීම පිණිස ලැබූ සුදුසුකම්, එම සුදුසුකම් ලබාගත් ආයතන, සමත්වූ අවසාන විභාගය හෝ එහි කොටස් විස්තර සඳහන් කරන්න.

(ii) සේවය කර ඇති දෙපාර්තමේන්තු තනතුර සිට දක්වා කාලසීමාව

| | සේවය කර ඇති දෙපාර්තමේන්තු | | තනතුර | සිට | දක්වා | කාලසීමාව |
|---|---|---|---|---|---|---|
| 1. | ———— | ——— | ——— | ——— | ——— | |
| 2. | ———— | ——— | ——— | ——— | ——— | |
| 3. | ———— | ——— | ——— | ——— | ——— | |

7. ව්‍යවස්ථා 5 ඇ 1 හි දක්වා ඇති සුදුසුකම් යටතේ ඉදිරිපත්වන අයදුම්කරුවන්ට පමණයි :

(i) සේවය/තනතුර :————.

(ii) ශ්‍රේණිය :———— වැනි දින සිට :————.

(iii) පන්තිය :———— වැනි දින සිට :————.

(iv) 1973. 07. 21 වැනි දිනට (අ) රජය යටතේ මුළු සේවය අවු :——, මාස :——, (ආ) ඉහත ii, iii හි සේවය :——.
(ii) අවු :——, මාස :——, (iii) අවු :——, මාස :——.

(v) 1973.07.21 වැනි දිනට වාර්ෂික වැටුප රු. :————.

8.

> විභාග ගාස්තුව ගෙවන ලද මුදල් භාරගැනීමේ කුවිතාන්සිය නො ගැලවී යන ලෙස එහි කොටසක් පමණක් ප්‍රවේශමෙන් මෙහි අලවන්න.

9. අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තුව ගෙවන ලද අංක :—— හා —— වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත්, සහතික කරමි. විභාග පිළිබඳ නීතිරීතිවලට එකඟව ක්‍රියාකිරීමටත් මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථා අනුව නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ පසුව හෝ මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමටත් මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10. දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ සහතිකය :

**මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ........................නමැති අයදුම්කරු........................ වැනි දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ වැඩ සහ හැසිරීම නිරන්තරයෙන්ම සතුටුදායක බවත් ඉහත 7 වැනි කොටුවෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ලම මෙම කාර්යාලයේ ඇති වාර්තා ආශ්‍රයෙන් මම පුද්ගලිකවම පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් 1973 ———— මස———— වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.**

————,
දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ අත්සන.

දිනය :————.

සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.

පදවිය :————.

ලිපිනය :————.

7-155—73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

රජයේ සංගීත විද්‍යාලයයේ (අභ්‍යන්තර හා බාහිර) මධ්‍යම හා අවසාන විභාග—1973

**විභාගය පවත්වන දිනය.**—මෙම විභාගයේ ශාස්ත්‍රය පිළිබඳ පරීක්ෂණය 1973 අගෝස්තු මස 20, 21 හා 22 වැනි දිනයන්හි කොළඹදී පවත්වනු ලැබේ. ප්‍රායෝගික පරීක්ෂණද කොළඹදී පවත්වනු ඇත. එය පවත්වනු ලබන දිනය හා ස්ථානය අයදුම්කරුවන්ට පසුව දැනුම් දෙනු ලැබේ.

2. **සුදුසුකම්.**—

2.01—මධ්‍යම :—අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ සමත් වී සිටිය යුතුය. අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් නම් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව හා අංක ගණිතය හෝ ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් සමත්වී සිටි යුතුය.

2.02—අවසාන :—I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ සමත්වී සිටිය යුතුය. අ.පො.ස. (සා.පෙ.) විභාගයෙන් නම් දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව හා අංක ගණිතය හෝ ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් හයකින් සමත්වී සිටිය යුතුය, හා

II. රජයේ සංගීත විද්‍යාලයයේ මධ්‍යම විභාගයෙන් සමත් වී සිටිය යුතුය. (අවසාන විභාගයට පෙනී සිටිය හැක්කේ මධ්‍යම විභාගයෙන් සමත්වූ විෂයයන්ගෙන් පමණකි.), නැතහොත්

"ලංකා ගාන්ධර්ව සභාවේ" "රජයේ නැටුම් විභාගයේ" අවසාන විභාගයෙන් සමත්ව සිටිය යුතුය.

3. **විභාග පරිපාටිය.**—ශිල්පය හා ශාස්ත්‍රය වශයෙන් මෙම විභාගය කොටස් දෙකකින් යුක්තය. ශිල්පය පිළිබඳ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලැබෙනුයේ ශාස්ත්‍රය යන කොටසින් සමත් වූ අයදුම්කරුවන්ට පමණී.

4. **මධ්‍යම විභාගය** (අභ්‍යන්තර/බාහිර).—

මේ සඳහා අයත් විෂයයන් පහත දැක්වේ :—

4.01—සිංහල සංගීතය (ශාස්ත්‍රය හා ශිල්පය)

4.02—හින්දුස්ථානි සංගීතය—ගායනය (ශාස්ත්‍රය හා ශිල්පය)

4.03—හින්දුස්ථානි සංගීතය—වාදනය : ස්වරවාද්‍ය (ශාස්ත්‍රය හා ශිල්පය)

4.04—හින්දුස්ථානි සංගීතය—වාදනය : අවනද්ධවාද්‍ය (ශාස්ත්‍රය හා ශිල්පය)

4.05—භාරතීය සංස්කෘතිය.

5. අවසාන විභාගය (අභ්‍යන්තර/බාහිර) :—

මේ සඳහා අයත් විෂයයන් පහත දැක්වේ :—

5.01—සිංහල සංගීතය—(ශාස්ත්‍රය හා ශිල්පය)

5.02—හින්දුස්ථානි සංගීතය—ගායනය (ශාස්ත්‍රය හා ශිල්පය)

5.03—හින්දුස්ථානි සංගීතය—වාදනය : ස්වරවාද්‍ය (ශාස්ත්‍රය හා ශිල්පය)

5.04—හින්දුස්ථානි සංගීතය—වාදනය : අවනද්ධවාද්‍ය (ශාස්ත්‍රය හා ශිල්පය)

5.05—හින්දුස්ථානි සංගීතයේ මූලධර්ම පරිනාමය.

6. ශාස්ත්‍රය පිළිබඳ ප්‍රශ්න පත්‍රයක කාලය පැ. තුනකි.

7. මධ්‍යම විභාගය සඳහා—

7.01—අංක 4 යටතේ දැක්වෙන 4.02, 4.03 හා 4.04 විෂයයන්ගෙන් එකකට හෝ දෙකකට පෙනී සිටිය හැකිය.

7.02—අවසාන විභාගය සඳහා— අංක 5 යටතේ දැක්වෙන 5.02, 5.03 හා 5.04 විෂයයන්ගෙන් එකකට හෝ දෙකකට පෙනී සිටිය හැකිය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

**රජයේ සංගීත විද්‍යාලයයේ (අභ්‍යන්තර/බාහිර/මධ්‍යම/අවසාන)* විභාගය—1973**

විභාග අංකය :—
(කාර්‍යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

1. අයදුම්කරුගේ නම : ව්‍යවහාර නාමය (මුලකුරු සහිතව) : සම්පූර්ණ නාමය : | ස්ත්‍රී පුරුෂ භාවය :

2. ලිපිනය :

3. අයදුම්කරුගේ උපන් දිනය : වයස :

4. අධ්‍යාපනික සුදුසුකම් (ගැසට් නිවේදනයේ 4 වන ඡෙදයේ සඳහන් විස්තර අනුව) විභාගය, සමත්වූ වර්ෂය, විෂයයන් හා ඒවායේ ශ්‍රේණි පැහැදිලිව සඳහන් කරන්න :

5. අයදුම්කරු ඉදිරිපත් වන්නේ මධ්‍යම හෝ අවසාන විභාගයට ද යන වග :—
6. මධ්‍යම විභාගය සම්පූර්ණ කර ඇත්නම් විභාග අංකය/අංක හා වර්ෂය/වර්ෂ (අවසාන විභාගය සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් සඳහා පමණයි.)
7. ගාන්දර්ව—අවසාන විභාගය සම්පූර්ණ කර ඇත්නම් විභාග අංකය/අංක හා වර්ෂය/වර්ෂයන්.

8. විභාගයට ගන්නා විෂයයන් : 1. 2. 3. 4. 5.

9. ඊට ප්‍රථම මෙම විභාගයට පෙනී සිට ඌණ සාමාර්ථයක් ලැබුවේ නම් එම වර්ෂය හා විභාග අංකය : වර්ෂය : විභාග අංකය :

10. විභාග ගාස්තු.—මාවිසින් මෙහි අලවන ලද මුද්දර කලින් පාවිච්චි නොකළ හොඳ මුද්දර බව මම සහතික කරමි.

මුද්දර අලවන කොටුව
මුද්දර එක පිට එක ඇලවිය යුතු නොවේ. අයදුම්කරුගේ අත්සන සහ දතම යොද මුද්දර අවලංගු කළ යුතුයි.

11. අයදුම්කරුගේ සහතිකය.—මේ අයදුම් පතෙහි ලියන ලද කරුණු සැබෑ බවට මම සහතික කරමි. තවද විභාග කොමසාරිස් තුමා විසින් ප්‍රසිද්ධ කරන ලද මේ විභාගය පිළිබඳ ව්‍යවස්ථාවලට සහ විභාග ශාලාවේදී අයදුම්කරුවන් සඳහා පනවන ලද අණපනත්වලටත් මා අවනත බැව් පිලිගනිමි.

..................................................
දිනය : අයදුම්කරුගේ අත්සන.

*අනවශ්‍ය කොටස් කපා හරින්න.

12. අයදුම්කරුගේ අනන්‍යතාව සහතික කිරීම :

.........................වන මම ඉහත සඳහන් වන අයදුම්කරු..............පදිංචි කෙනෙකු බවද මා ඔහු/ඇය හොඳාකාර අඳුනන බවද, 19...... ක්වූ .................මස.........වැනි දින මා ඉදිරියෙහි අත්සන් තබන ලද බවද සහතික කරමි.

ලිපිනය : ...........................................................
...........................................................
...........................................................

අයදුම්කරුගේ අත්සන :–
සහතික කරන අයගේ අත්සන :–
තරාතිරම :—
දිනය :—

**විභාගාපේක්ෂකයන් සඳහා නීති**

සියලුම විභාගාපේක්ෂකයන් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂක යෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ :—

(i) මුළු විභාගයට ම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම් තහනම් කිරීම.
(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයට ම හෝ නුසුදුස් සකු කිරීම ;
(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම ;
(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම :
(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම ;
(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට බාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාග අපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත්, රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

**නීති**

1. සියලුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද ඔහුගේ සහකාරයන්ට ද අනික් විභාගාපේක්ෂකයන්ටද, බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්ත දාන්තව හැසිරිය යුතුයි. විභාග ශාලාවට ඇතුළුවන විටත් ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේත් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුයි.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන් ගෙන පැය බාගයක් ගත වූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය බාගයක් ගතවනතුරු ප්‍රශ්න පත්‍රයකට පෙනී සිටින අපේක්ෂකයකුට විභාග ශාලාවෙන් පිටවී යාම ද තහනම් ය. ප්‍රායෝගික පරීක්ෂණ වලට හෝ වාචක පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයකුම තමාගේ විභාග අංකය දරණ ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුයි. විභාග ශාලාධිපතීන්ගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුයි. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්යමණ්ඩලයේ කෙනකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ ඉන් පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පනිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම් ය. යම්කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතීන්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයකුගේ උත්තර පත්‍රය අඳුනා ගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයකුගේ විභාග අංකය ලිවීම වචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනා ගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදු වෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසියෙහි හැර, තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුයි. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරා දැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකා මකා දැමීම හෝ නොකළ යුතුය. කටු වැඩ ආදිය සඳහා පාවිච්චි

සිටිය යුතුය. එය පළවූ විට එහි සඳහන් උපදෙස් අනුව වහාම ක්‍රියා කළ යුතුය.

(අ) යම් හෙයකින් අයදුම්කරුවෙකුට ප්‍රවේශ පත්‍රයක් නොලැබුණ හොත් ඔහු විසින් කොළඹ 2, මැලේ වීදියේ, විභාග කොමසාරිස් වෙත (තැපැල් පෙට්ටිය අංක 1503, විදුලි පණිවුඩ ලිපිනය : "විභාග", කොළඹ) ප්‍රවේශ පත්‍රය නොලැබුණ බව නොපමාවම දන්වා එවිය යුතුයි. විදුලි පුවතකින් මෙසේ දැන්වීම වඩා හොඳය. හැකිනම් පැමිණ කොළඹ ආදුරුප්පු වීදියේ, අංක 130 දරණ ස්ථානයේ පිහිටි ප්‍රවේශ පත්‍ර ශාඛාවෙන් විමසන්න. ඒ සෑම විටකම පහත සඳහන් විස්තරය සැපයිය යුතුය. එනම් :—

(i) විභාගයේ නම ;

(ii) අයදුම්කරුගේ සම්පූර්ණ නම :

(iii) සම්පූර්ණ ලිපිනය ;

(iv) අයදුම්පත එවූ දිනය, එය රෙජිස්ටර් කළ තැපැල් පළ හා රෙජිස්ටර් අංකය.

14. හැඳින්වීමේ පත්‍ර.—(i) අයදුම්කරුවන් විසින් විභාග ශාලාවේදී තමන් එක් එක් විෂයකට පෙනී සිටින විට විභාග ශාලාධිපතින්ට පිළිගත හැකි පරිදි තමන් පිළිබඳ හැඳින්වීම ඔප්පු කළ යුතුයි. මේ සඳහා පහත සඳහන් වන ලියවිලිවලින් එකක් පිළිගනු ලැබේ :—

(ඒ) පෝස්ට්මාස්ටර් ජනරාල්තුමා විසින් නිකුත් කරන ලද හැඳින්වීමේ පත්‍රිකාවක් (Identity Card),

(බී) විභාග දිනයට කලින් තුන් අවුරුද්ද ඇතුළත නිකුත් කරන ලද්දාවූ ද වලංගුව පවත්නා වූද් "පාස්පෝට්" (Passport) බලපත්‍රයක්.

(සී) විභාග දිනයට කලින් තුන් අවුරුද්ද තුළ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් විසින් හෝ රජයේ ආඥාවකින් බලය ලත් ආයතනයකින් හෝ නිකුත් කරන ලද්දා වූද, තම ඡායා රූපය දරන්නාවූද සහතික පත්‍රයක් හෝ බලපත්‍රයක් (Licence) හෝ වෙනත් ලියවිල්ලක්,

(ඩී) පාස්පෝට් ප්‍රමාණයේ ඡායාරූපයක්, එහි පිටපැත්තේ පහත දැක්වෙන සහතිකය සැපයිය යුතුය. එසේ සහතික කළ යුත්තේ අත්සන් පත්‍රය සහතික කිරීමට බලය ලත් කෙනෙකු විසින් ය :—

පිට පැත්තේ පෙනෙන ඡායාරූපය .................(අයදුම්කරුගේ සම්පූර්ණ නම).......................ගේ බවත්, පහත යොදා ඇත්තේ ඔහුගේ/ඇගේ අත්සන බවත්, මම සහතික කරමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

————————,
සහතික කරන්නාගේ අත්සන.

————————
නම සහ තත්ත්වය.

ඉහත දක්වෙන ලියකියවිලි වලින් එකක් ඉදිරිපත් නොකළ අයදුම්කරුවන්ගේ විභාග අපේක්ෂකත්වය තාවකාලික ලෙස සලකනු ලැබේ. විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි එවැන්නකුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ.

මෙම ව්‍යවස්ථාවන්හි සඳහන් නොවූ යම්කිසි කරුණක් පිළිබඳ තීරණය විභාග කොමසාරිස් විසින් කරනු ලැබේ.

**බෝගොඩ පේ‍්‍රමරත්න.**
විභාග කොමසාරිස්

1973 ජූලි මස 06 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයේ (අභ්‍යන්තර/බාහිර/මධ්‍යම/අවසාන)* විභාගය—1973

විභාග අංකය :————
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

| | | |
|---|---|---|
| 1. අයදුම්කරුගේ නම | ව්‍යවහාර නාමය (මුලකුරු සහිතව) :—<br>සම්පූර්ණ නාමය :— | ස්ත්‍රී පුරුෂ භාවය :— |
| 2. ලිපිනය | | |
| 3. අයදුම්කරුගේ උපන් දිනය | | වයස :— |
| 4. අධ්‍යාපනික සුදුසුකම් (ගැසට් නිවේදනයේ 4 වන ඡේදයේ සඳහන් විස්තර අනුව) විභාගය, සමත්වූ වර්ෂය, විෂයයන් හා ඒවායේ ශ්‍රේණි පැහැදිලිව සඳහන් කරන්න : | | |

5. අයදුම්කරු ඉදිරිපත් වන්නේ මධ්‍යම හෝ අවසාන විභාගයට ද යන වග :—

6. මධ්‍යම විභාගය සම්පූර්ණ කර ඇත්නම් විභාග අංකය/අංක හා වර්ෂය/වර්ෂ (අවසාන විභාගය සඳහා ඉදිරිපත් වන අයදුම්කරුවන් සඳහා පමණයි.) :—

7. ගාන්දර්ව—අවසාන විභාගය සම්පූර්ණ කර ඇත්නම් විභාග අංකය/අංක හා වර්ෂය/වර්ෂයන් :—

8. විභාගයට ගන්නා විෂයයන් : 1.   2.   3.   4.   5.

| | | |
|---|---|---|
| 9. මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිට ඌණ සාමාර්ථයක් ලැබුවේ නම් එම වර්ෂය හා විභාග අංකය :— | වර්ෂය :— | විභාග අංකය :— |
| 10. විභාග ගාස්තු.—මවිසින් මෙහි අලවන ලද මුද්දර කලින් පාවිච්චි නොකළ හොඳ මුද්දර බව මම සහතික කරමි. | මුද්දර අලවන කොටුව<br>මුද්දර එක පිට එක ඇලවිය යුතු නොවේ. අයදුම්කරුගේ අත්සන සහ දතම යොද මුද්දර අවලංගු කළ යුතුයි. | |

11. **අයදුම්කරුගේ සහතිකය.**—මේ අයදුම් පතෙහි ලියන ලද කරුණු සැබෑ බවට මම සහතික කරමි. තවද විභාග කොමසාරිස් තුමා විසින් ප්‍රසිද්ධ කරන ලද මේ විභාගය පිළිබඳ ව්‍යවස්ථාවලට සහ විභාග ශාලාවේදී අයදුම්කරුවන් සඳහා පනවන ලද අණපනත්වලටත් මා අවනත බැව් පිළිගනිමි.

————————
අයදුම්කරුගේ අත්සන.

දිනය :————

*අනවශ්‍ය කොටස් කපා හරින්න.

12. **අයදුම්කරුගේ අනන්‍යතාව සහතික කිරීම :**

..............................වන මම ඉහත සඳහන් වන අයදුම්කරු..................................පදිංචි කෙනෙකු බවද, මා ඔහු/ඇය හොඳාකාර අඳුනන බවද, 19......ක්වූ..................මස.........වැනි දින මා ඉදිරියෙහි අත්සන් තබන ලද බවද සහතික කරමි.

අයදුම්කරුගේ අත්සන :————
සහතික කරන අයගේ අත්සන :————
තරාතිරම :————
දිනය :————

ලිපිනය : ............................................
............................................
............................................

විභාග ශාලාවට ගෙන ඊමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්ට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සලසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම් :—ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ප්‍රස්තාර කඩදාසි, ලෙජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි ආදිය) සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතීන්ට දන්විය යුතුය. විභාග ශාලාවේදී ඔබට ම දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නො කර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝු ගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරෙස්සමෙන් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුයි.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්තකුඩු, මකන රබර් කෑලි, අඩි කෝදු, ජ්‍යාමිති උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේ ම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවාට පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන හැම දෙයක් ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නො ලිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන් කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නො ලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතු වන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුයි.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින් ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමෙන් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදු විය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම් සහ කටුවැඩ ඒ ඒ ගණන සෑදීමේ කොටසක් වශයෙන්, අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුයි. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් සහ චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහනක් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමු කර වීය යුතු අවස්ථාවලදී ඒ රූප සටහන නැවත නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) ඒක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ල ම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතු කොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කෑබැල්ලෙන් නො ගැලවී යන පරිදි එකට තබා අමුණා ගැට ගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතකුට හෝ සියතින්ම බාර දිය යුතුය. නැත හොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේ ම වාඩි වී සිටිය යුතුය. මෙසේ නො කිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිව යාමට ද ඔබ යම් විෂයකට ඉදිරිපත් නොවූ වකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙන යම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාගශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීම අවශ්‍යවූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

7-156/2 —73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

### ලංකා වෛද්‍ය විද්‍යාලයීය සභාව

#### වතු ඖෂධ සංයෝජකයන් අනුමත කිරීම සඳහා විභාගය

වතු ඖෂධ සංයෝජකයන් ලෙස අනුමතිය ලැබීමට කැමති අය සඳහා විභාගයක් 1973 අගෝස්තු මස 15 වෙනි දින වෛද්‍ය පීඨයේදී පවත්වනු ලැබේ.

#### අයදුම්පත්

2. විභාග අයදුම්පත් 1973 ජූලි මස 21 වන දින දහවල් 12 ට පෙර ලැබෙන සේ ලේඛකාධිකාරී, ලංකා වෛද්‍ය විද්‍යාලයීය සභාව, කින්සි පාර, කොළඹ 8 යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි.

#### අයදුම්පත් පහත සඳහන් අන්දමට එවිය යුතුයි

3. අයදුම්කරුවන් තම අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී පහත සඳහන් දෑ සනාථ කළ යුතුයි :—

(1) පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලාංකික පුරවැසියෙක් බව,

(2) සුදුසුකම් ලැබූ සහායක වෛද්‍ය වෘත්තිකයෙකු (ඇපොතිකරි) නොවන බවට, සහ

(3) පහත සඳහන් සුදුසුකම් වලින් එකක් තිබෙන බවට :—

(අ) අවුරුදු දෙකකට නොඅඩු කාලයක් තුල වෛද්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ බලන සහායක වෛද්‍ය වෘත්තිකයෙකු ලෙස සේවයෙහි යෙදී සිටීම, හෝ

(ආ) ලංකා වෛද්‍ය විද්‍යාලයීය සභාවේ ඖෂධ වේදී විභාගය සමත්ව සිටීම, සහ

(1) සුදුසුකම් ලැබූ වෛද්‍ය වෘත්තිකයෙකු යටතේ අවුරුදු 3 කට නොඅඩු කාලයක් සේවය කර තිබීම ; සහ

(2) වෛද්‍ය අවශ්‍යතා ව්‍යවස්ථාවේ 176 ඡේදය යටතේ පිළිගනු ලබන වතු ආරෝග්‍ය ශාලාවක වසරක් සේවය කර තිබීම හෝ වෛද්‍ය ව්‍යවස්ථාව යටතේ ලියාපදිංචි වෛද්‍ය වෘත්තිකයෙකු විසින් පවත්වා ගෙන යන ආරෝග්‍ය ශාලාවක සය මසක් සේවය කර තිබීම.

හෝ

(ඇ) ලංකා වෛද්‍ය විද්‍යාලයීය සභාවේ ඖෂධවේදී විභාගය සමත්ව තිබීම, සහ

(1) අවුරුදු තුනකට නො අඩු කාලයක් සහාය ඖෂධ සංයෝජකයෙකු ලෙස වත්තක සේවය කර තිබීම සහ,

(2) වෛද්‍ය අවශ්‍යතා ව්‍යවස්ථාවේ 176 ඡේදය යටතේ පිළිගනු ලබන වතු ආරෝග්‍ය ශාලාවක වසරක් සේවය කර තිබීම, හෝ සෞඛ්‍යසේවා දෙපාර්තමේන්තුවේ ආරෝග්‍යශාලාවක හෝ වෛද්‍ය ව්‍යවස්ථාව යටතේ ලියාපදිංචිවූ වෛද්‍ය වෘත්තිකයෙකු විසින් පවත්වාගෙන යන ආරෝග්‍යශාලාවක හය මසක් සේවය කර තිබීම හෝ

(ඈ) ලංකා වෛද්‍ය විද්‍යාලයීය සභාවේ ඖෂධවේදී විභාගය සමත් වී තිබීම, සහ

(1) වෛද්‍ය දෙපාර්තමේන්තුවේ හෝ යුදහමුදා වෛද්‍ය දෙපාර්තමේන්තුවේ සේවය කර තිබීම.

(2) වෛද්‍ය අවශ්‍යතා ව්‍යවස්ථාවේ 176 ඡේදය යටතේ පිළිගනු ලබන වතු ආරෝග්‍යශාලාවක වසරක් සේවය කර තිබීම හෝ සෞඛ්‍යසේවා දෙපාර්තමේන්තුවේ ආරෝග්‍යශාලාවක හෝ වෛද්‍ය ව්‍යවස්ථාව යටතේ ලියාපදිංචි වූ වෛද්‍ය වෘත්තිකයෙකු විසින් පවත්වා ගෙන යන ආරෝග්‍යශාලාවක හය මසක් සේවය කර තිබීම, හෝ

(ඉ) සම

4. විභාග අයදුම්පත් ගාස්තුව ලෙස, ශ්‍රී ලංකා ජනරජයේ ගිණුමට රුපියල් 45 ක් බැර කොට ඕනෑම කච්චේරියකින් ලබාගත් කුවිතාන්සියක් අයදුම්පතට ඇමිණිය යුතුයි.

5. කුමන අවස්ථාවකදී හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

#### අයදුම් පත්‍රය

(මෙම අයදුම්පත පිටපත් කර පරීක්ෂාකාරීව පුරවා එවිය යුතුයි.)

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

2. ස්ථිර ලිපිනය :————.

3. (අ) ජාතිය :————.

(ආ) ඔබ ලංකා පුරවැසියෙක් ද ? :————.

(ඇ) උපන් දිනය :————.

(නො :......... දරණ උප්පැන්න සහතිකය අමුණා ඇත.)

(ඈ) අයදුම්කරු හෝ ඔහුගේ පියා ලංකාවේ ඉපදී නැතිනම්, ලංකා පුරවැසි භාවය ලැබීමේ ලියකියවිලි ඇමිණිය යුතුයි.

4. ඔබ විභාගය සඳහා සුදුසුකම් ලබා ඇත්තේ 3 වන රෙගුලාසියේ (අ) සිට (ඉ) දක්වා ඇති කුමන අනුඡේදය යටතේ දැයි සඳහන් කරන්න :————.

5. (අ) අනුඡේදය යටතේ නම් වැඩබැලීමේ සේවාකාලය සඳහන් කරන්න. එය සනාථ කිරීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂතුමාගෙන් ලබාගත් ලිපියක් ඉදිරිපත් කරන්න :————.

6. (ආ), (ඇ) හෝ (ඈ) අනුඡේදය යටතේ නම් පහත සඳහන් දෑ සඳහන් කර එම සේවය සනාථ කිරීමේ ලිය කියවිලි ඉදිරිපත් කරන්න :—

(1) ඖෂධ වේදියෙකු වශයෙන් සුදුසුකම් ලැබූ දිනය (ඖෂධ වේදියෙකු ලෙස ලැබූ ප්‍රවීනතා සහතිකය ඇමිණිය යුතුයි.) :————.

(2) සුදුසුකම් ලත් වෛද්‍ය වෘත්තිකයෙකු යටතේ කල සේවා කාලය (එම කාලයත්, වෛද්‍ය වෘත්තිකයාගේ නමත් සඳහන් කරන්න. සාක්ෂි ඇමිණිය යුතුයි.) :————.

(3) වෛද්‍ය දෙපාර්තමේන්තුවේ හෝ වෛද්‍ය වෘත්තිකයෙකුගේ ආරෝග්‍යශාලාවක සේවා කාලය (ආරෝග්‍ය ශාලාවේ නම, සේවා කාලය සහ වෛද්‍ය වෘත්තිකයාගේ නම සඳහන් කරන්න, සාක්ෂි ඇමිණිය යුතුයි.) :————.

(4) වතු ආරෝග්‍යශාලාවේ නම හා එවැනි ආරෝග්‍යශාලාවක සේවා කාලයත් සඳහන් කරන්න. (සාක්ෂි ඇමිණිය යුතුයි.) :————.

(5) වෛද්‍ය දෙපාර්තමේන්තුවේ හෝ යුද හමුදා වෛද්‍ය දෙපාර්තමේන්තුවේ සේවය. (සාක්ෂි ඇමිණිය යුතුයි.) :————.

7. (ඉ) අනුඡේදය යටතේ නම් ඔබ පළමුවන ශ්‍රේණියේද දෙවෙනි ශ්‍රේණියේද යන්න සඳහන් කරන්න. (සාක්ෂි සපයන්න.) :————.

8. කච්චේරියට ගෙවූ රු. 45 සඳහා කුවිතාන්සිය. (අංක............. දරණ කුවිතාන්සිය අමුනා ඇත.)

9. මීට පෙර මෙම විභාගයට පෙනී සිට තිබේද? එසේ නම් දිනය හා ප්‍රතිඵල :————.

ඉහත සඳහන් ප්‍රකාශයන් සත්‍ය බව ප්‍රකාශ කරමි.

————,
අත්සන.

දිනය :————.

7–126/1—73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

**ලංකා වෛද්‍ය විද්‍යාලීය සභාව**

බැහිර ඖෂධවේදීන්ගේ (පාර්මසිස්ට්) විභාගය

අවුරුදු දෙකක කාලයක් 57 (1) (බී) වෛද්‍ය ආඥාපනත යටතේ ඖෂධවේදී ආධුනික (ලංකාවේ නීත්‍යානුකූල බලතල අධි. 90) කාලයක් සම්පූර්ණ කල ඖෂධවේදී ආධුනිකයින් සඳහා විභාගයක් 1973 සැප්තැම්බර් මස 3 දින ලංකා වෛද්‍ය විද්‍යාලයේදී පැවැත්වේ. මෙම විභාගයට පෙනී සිටිය හැක්කේ 1971 දෙසැම්බර් මස 31 වැනි දිනට ප්‍රථමයෙන් ආධුනිකයින් වශයෙන් බැඳුන අයට පමණය.

විභාග ගාස්තු වශයෙන් රු. 45 ක මුදලක් ලංකාණ්ඩුවට බැරකොට තැන්පත් කරන ලද බවට කච්චේරියකින් ලබා ගත් කුවිතාන්සිය මා වෙත 1973 අගෝස්තු මස 11 දින දහවල් 12 ට ප්‍රථම ඉදිරිපත් කළ යුතුය. ආධුනිකයින්ගේ සම්පූර්ණ නම සහ ඖෂධවේදී ආධුනිකයෙකු ලෙස ඇතුල්වීමේ සහතික පත්‍රයේ ඇති සවිර කරන ලද නොම්මරය, කුවිතාන්සිය සමග එවිය යුතුය. මුදල් ආපසු ගෙවීමක් නොමැත.

ආර්. ඒ. නවරත්න,
ලේඛකාධිකාරී,
ලංකා වෛද්‍ය විද්‍යාලීය සභාව.

කොළඹ 8,
1973 ජූනි මස දිය.

7-126/2—73.07.06 දින අංක 67 දරණ ගැසට් පත්‍රය

---

**රජයේ ගණකාධිකාරි සේවයේ IV වැනි පංතියට පත්කිරීමේ විවෘත තරඟ විභාගය—1973**

1973 ජූනි මස 08 වැනි දින අංක 63 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටස: (IIඅ) ඡේදයේ පල කරන ලද යථොක්ත විභාගය සම්බන්ධයෙන් වූ නිවේදනය කෙරෙහි අපේක්ෂකයින්ගේ අවධානය මෙයින් යොමු කරනු ලැබේ.

එම ගැසට් නිවේදනයට පහත දැක්වෙන සංශෝධනයන් එක් කරනු ලැබේ :—

2. ලිඛිත විභාගය 1973 අගෝස්තු මස 20, 21 සහ 22 වැනි දින යන්හිදී කොළඹ දී පැවැත්වෙනු ඇත.

**3. විභාගයට පෙනී සිටීම සඳහා ඉල්ලුම් කිරීමේ ක්‍රමය :**

(අ) මුද්‍රිත අයදුම් පෝර්ම විභාග කොමසාරිස් විසින් නිකුත් කරනු නොලැබේ. මෙම නිවේදනයේ අවසානයෙහි දැක්වෙන ආදර්ශ අයදුම් පත්‍රය අනුව, අපේක්ෂකයින් විසින් ම අයදුම්පත් සකස් කරගත යුතුය. මේ සඳහා අඟල් $8\frac{1}{2} \times 12$ ප්‍රල්ස්කැප් ප්‍රමාණයේ තනි කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම් පත් සකස් කරගත යුතුය.

(ආ) මෙම විභාගය සඳහා ගාස්තුව රුපියල් 200 කි. මේ සඳහා ගාස්තු ආදායම් ශීර්ෂ 6, උප ශීර්ෂ 2, විෂයය 5 ට බැර කරන ලෙසට උපදෙස් සහිතව ඉල්ලුම් පත්‍රය භාර ගන්නා අවසාන දිනයට ප්‍රථම ලඟම ඇති කච්චේරියට හෝ කොළඹ මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතුය. කච්චේරියෙන් හෝ මහා භාණ්ඩාගාරයෙන් ලබාගත් කුවිතාන්සිය තම ඉල්ලුම් පත්‍රයට ඇලවිය යුතුය.

(ඇ) මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තු කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන් හෝ අර්ධ වශයෙන් ආපසු ගෙවනු නොලැබේ. නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම් පත් විභාග කොමසාරිස්, තැ. පෙ. 1503, කොළඹ 2 යන ලිපිනයට 1973 ජූලි මස 21 වැනි දිනට ප්‍රථම ලැබෙන සේ රෙජිස්ටර් තැපෑලෙන් යැවිය යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් බහා එවන කවරයේ උඩ කෙලවරේ "රජයේ ගණකාධිකාරී සේවයට පත් කිරීමේ විවෘත තරඟ විභාගය" යනුවෙන් ද සඳහන් කළ යුතුය.

(ඊ) අයදුම්පත් ලැබුණු බව විභාග කොමසාරිස් විසින් අපේක්ෂකයින්ට දන්වනු ලැබේ. තම අයදුම්පත ලැබුණු බව අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත දැනුම් දෙනු නොලැබුවහොත් ඔහු විසින් ඒ බව වහාම විභාග කොමසාරිස් වෙත දැනුම් දිය යුතුය. එසේ විමසා නොලැබීමෙන් සමහරවිට විභාගයට පෙනී සිටීමේ අවස්ථාව අයදුම්කරුට නොලැබී යාමට ද ඉඩ ඇත.

**6. යෝග්‍යතාව පිළිබඳ කොන්දේසි :**

(ආ) ඔහු/ඇය 1973 ජූලි මස 21 වැනි දිනට වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුක්තව සිටින අය සම්බන්ධයෙන් වයස් සීමාව බලපානු නොලැබේ.

1973 ජූනි මස 08 වැනි දින අංක 63 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පල කරන ලද මෙම විභාගය සම්බන්ධයෙන් ඇති නිවේදනයේ අනිකුත් කරුණු සහ කොන්දේසි එසේම බල පැවැත්වේ.

පී. එච්. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්.

1973 ජූනි මස 27 වැනි දින,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව,
ටොරිංටන් චතුරශ්‍රය, කොළඹ 7.
1/23/30/4 (ඡ).

**ආදර්ශ අයදුම් පත්‍රය**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**ගණකාධිකාරී සේවයේ IV වැනි පන්තියට පත් කිරීමේ විවෘත තරඟ විභාගය—1973**

විභාග අංකය ;————.
(කාර්‍යාලීය ප්‍රයෝජනය පිණිසයි)

1. (i) මුලකුරු සමඟ අගට යෙදෙන නම :————.
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.

2. සම්පූර්ණ ලිපිනය :————.

3. ස්ත්‍රී පුරුෂ භාවය :————.

4. (i) උපන් දිනය :————.
(ii) ස්ථානය :————.
(iii) 1973 ජූලි මස 21 වැනි දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.

5. ඔබ ලංකාවේ පුරවැසියකු වන්නේ පරම්පරාවෙන්ද නැතහොත් ලියාපදිංචි කිරීමෙන්ද ? :————.

6. විභාගයට පෙනී සිටින මාධ්‍යය :————.

7. ව්‍යවස්ථා (6) (ඇ) යටතේ මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුවීම පිණිස ලැබූ සුදුසුකම්, සුදුසුකම් ලබාගත් ආයතන, සමත්වූ අවසාන විභාගය හෝ එහි කොටස් විස්තර සහිතව සඳහන් කරන්න ;————.

8. තම චරිතය හා තත්ත්වය ගැන විනිශ්චයක් දීමට අයදුම්කරු නම් කරන දෙදෙනාගේ නම් සහ ලිපිනය :
1. :————.
2. :————.

9.

| විභාග ගාස්තු ගෙවන ලද මුදල් භාරගැනීමේ කුවිතාන්සිය ගැලවී නොයන ලෙස එහි කොටසක් පමණක් ප්‍රවේශමෙන් මෙහි අලවන්න |
| --- |

10. (i) අයදුම්කරුගේ සහතිකය :—

මෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීම හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තුව ගෙවන ලද අංක............හා............වැනි දින දරණ මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත්, ප්‍රකාශ කරමි. විභාග පිළිබඳ නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථා අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ මගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

(ii) අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (ගැසට් නිවේදනයේ 3 වැනි ඡෙදයේ (ඇ) උප ඡෙදය බලන්න).

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන...........නැමැති අයදුම්කරු මා පෞද්ගලික වශයෙන් දන්නා අඳුනන බවත්, 1973...........මස...........වැනි දින ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

————,
අත්සන සහතික කරන අයගේ අත්සන.

දිනය :————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :————.
පදවිය :————.
ලිපිනය :————.

7-154—73.07.06 වැනි දින අංක 67 දරන ගැසට් පත්‍රය

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ

# දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරනු ලබන

# සංශොධිත ගාස්තු

1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට ක්‍රියාත්මක වේ

(සෑම සිකුරාද දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග **කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති** තැනට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සෙනසුරාද පෙරවරු 8 සිට දහවල් 12 දක්වා ද, වෙනත් දිනවල පෙරවරු 8 සිට පස්වරු 3.30 දක්වා ද කාර්‍යාලයේ කටයුතු කරන කාලය බව සැළකිය යුතුයි.

4. සෙනසුරාද පෙරවරු 11 ට සහ වෙනත් දිනවල පස්වරු 2.30 ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. **සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි.** තැපෑලෙන් දැන්වීම් සහ ප්‍රකාශන යන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වළක්වා ගැනීම සඳහා, පළකරන්නට නියමිත " පිටපත " **කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි.** ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. **සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.**

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.

10. 1968 දෙසැම්බර් මස 1 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 20 | 0 |
| වැඩි වන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... | 20 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 220 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 440 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. **සෑම සිකුරාද දිනයකම ශ්‍රී ලංකා ජනරජයේ " ගැසට් " පත්‍රය පළ කරනු ලැබේ.** ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. **1966 මාර්තු 1 වෙනිද සිට ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ, මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි.**

13. 1968.12.1 දින සිට සංශෝධිත දයක ගාස්තු :—

**ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය—වර්ෂික**

| | මෙරට රු. | ශ. | පිටරට රු. | ශ. |
|---|---|---|---|---|
| එක් කොටසක් ... ... ... | 46 | 0 | 60 | 0 |
| I වැනි කොටසේ එක ඡෙදයක් ... ... | 36 | 0 | 42 | 0 |
| I වැනි කොටසේ ඡෙද දෙකක් ... ... | 43 | 50 | 51 | 50 |

**වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දයක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.**

***තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)**

| | මිළ රු. ශ. | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|
| (අ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළතදී, එක කොටසක් ... ... | 0 50 | 0 20 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු, එක කොටසක් ... ... ... | 1 0 | 0 20 |
| (ආ) (i) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 30 | 0 15 |
| (ii) ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් මසකට පසු I වැනි කොටසේ එක ඡෙදයක් ... | 0 60 | 0 15 |

**දයක මුදල් බාර ගැනීම සහ තනි පිටපත් විකිණීම බාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.**

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|---|
| ජුලි | 73.07.06 | සිකුරාද | ... | 73.06.27 | බදාද | දවල් | 12.00 |
| | 73.07.13 | සිකුරාද | ... | 73.07.04 | බදාද | දවල් | 12.00 |
| | 73.07.20 | සිකුරාද | ... | 73.07.11 | බදාද | දවල් | 12.00 |
| | 73.07.27 | සිකුරාද | ... | 73.07.18 | බදාද | දවල් | 12.00 |
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... | 73.07.25 | බදාද | දවල් | 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... | 73.08.01 | බදාද | දවල් | 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... | 73.08.08 | බදාද | දවල් | 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... | 73.08.15 | බදාද | දවල් | 12.00 |
| | 73.08.31 | සිකුරාද | .. | 73.08.22 | බදාද | දවල් | 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... | 73.08.29 | බදාද | දවල් | 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... | 73.09.05 | බදාද | දවල් | 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... | 73.09.11 | බදාද | දවල් | 12.00 |
| | 73.09 28 | සිකුරාද | ... | 73.09.19 | බදාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. ඩී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.